**වර්ෂ 2022 ඔක්තෝම්බර් 14 වන දින පෙ.ව. 09.30 ට පවත්වන්නට යෙදුනු කුරුවිට ප්‍රාදේශීය සභාවේ මහා සභා රැස්වීමේ වාර්තාව :-**

- **සභාපතිතුමා මූලසුන ගැනීම** :- ගරු සභාපතිතුමා විසින් පැමිණි සිටි සියළු දෙනා පිලිගන්නා ලදී. මහ සභාවේ පෙ.ව. 9.30 වන විට සණ පූර්ණය නොමැති හෙයින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණි ප්‍රේමාගමලත් මිය විසින් මහ සභාවේ කටයුතු පෙ.ව. 10 දක්වා කල්තැබීමට යෝජනා කල අතර එය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණි ඉන්ද්‍රාණි වික්‍රමසිංහ මිය විසින් ස්ථිර කරන ලදී.

පැමිණීම - මෙදින රැස්වීම සඳහා පහත නම් සඳහන් ගරු මන්ත්‍රීතුමන්ලා සහ ගරු මන්ත්‍රීතුමියන්ලා සහභාගි විය.

අනු.අ

..........................................................................

01-1 පසුගිය මහා සභා රැස්වීම් වාර්තාව සහා සම්මත කිරිම(2022.07.08)

**ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා**

2022.07.08 වන දින මහ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කරන ලෙස යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ණි ප්‍රේමා ගම්ලත් මිය**

2022.07.08 වන දින මහ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව ස්ථිර කරමි.

**Xxxxxxxxxxxxx** 2022.07.08 වන දින මහ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව **ඒකමතිකව මහා සභා සම්මත විය. Xxxxxxxxxxx**

01-2 විශේෂ මහා සභා රැස්වීම් වාර්තාව සහා සම්මත කිරිම(2022.07.18)

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.සෝමරත්න මහතා**

22.07.18 විශේෂ මහා සභා රැස්වීම් වාර්තාව සංශෝධනයන්ට යටත්ව මහා සභා සම්මත කරන ලෙස යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ණි ප්‍රේමා ගම්ලත් මිය**

22.07.18 විශේෂ මහා සභා රැස්වීම් වාර්තාව සංශෝධනයන්ට යටත්ව ස්ථිර කරමි.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

**Xxxxxxxxxxxxxxx** 22.07.18 විශේෂ මහා සභා රැස්වීම් වාර්තාව සංශෝධනයන්ට යටත්ව **ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

## 2. සභාපතිතුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන -

3. <u>ප්‍රාදේශීය සභාව අමතා එවන ලද ලිපි සංදේශ , පෙත්සම්, පැමිණිලි, හා සන්නිවේදන -නොමැත</u>

4. <u>යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න :-</u> නොමැත

5. <u>යථා පරිදි කල්දී ඇති යෝජනා :-</u>

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා</u>

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

**Xxxxxxxxxxxxxx <u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා ගේ</u> යෝජනාව අනුව සූර්ය කෝෂ භාවිතයෙන් විදුලි බල ශක්තිය උත්පාදනය කිරිම සඳහා විධිමත් තාක්ෂනික උපදෙස් මත කුරුවිට ප්‍රාදේශිය සභාවට අයත් සුදුසු ගොඩනැගිලි වල සූර්ය කෝෂ පැනල් ස්ථාපිත කිරීමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx**

**05-02**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

**Xxxxxxxxxxxxxx <u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා ගේ</u> යෝජනාව අනුව රට අර්බුධයට පත්ව ඇති අවස්ථාවේ යලි යථා තත්වයට පත්කර ගොඩනංවා සිටුවිම සඳහා අභිනවයෙන් පත්වූ ගරු ජනාධිපතිතුමාට හා ඉදිරියේ පිහිටුවීමට නියමිත සර්වපාක්ෂික ආණ්ඩුවට සියළු පළාත් පාලන ආයතනවල සහාය පල කිරීමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

**Xxxxxxxxxxxxxx_ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී <u>ආර්.සෝමරත්න</u> මහතාගේ යෝජනාව අනුව කුරුවිට නගර සංවර්ධනයට අත්‍යාවශ්‍ය, කුරුවිට නගරය ආසන්නයේ පිහිටා ඇති දෙල්ගහඹිවිට ඉඩම නාගරික සංවර්ධන අධිකාරිය මගින් පවරාගැනීමට හා ඒ සඳහා ප්‍රතිදන ලක්ෂ 50 ක් සභාවේ ස්ථාවර තැන්පතු අරමුදලෙන් ලබා ගැනීමටත් ඉතිරි ලක්ෂ 50 ලැබෙන්න තියෙන උසාවි දඩ හා මුද්දර ගාස්තු ලෙස ප්‍රතිපාදන ලැබෙන අයුරින් සභා අරමුදලින් වැයබර දැරීම ට මහා සභා අනුමැතිය ලබාදීට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

**Xxxxxxxxxxxxxx <u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ශානක දර්ශන</u> මහතා ගේ යෝජනාව අනුව දොඩම්පෙ,නාවල පිහිටි කුරුවිට ප්‍රාදේශිය සභාවට අයත් ප්‍රජා ශාලාව පස් කන්දක් හේතුවෙන් අනතුරට පත්වෙමින් පවතින බැවින් එම අනතුරුදායක තත්වය ඉවත්කරගැනීමට සභාවේ**

**දායකත්වය ලෙස බැකෝ යන්ත්‍රය යොදා පස්ඉවත්කර ගැනිමට හෝ කාර්මික නිලධාරිවාර්තා අනුව සුදුසු ක්‍රමවේදයක් යෙදිමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

**Xxxxxxxxxxxxxxx <u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චන්දිම යුරේශ් පතිරන</u> මහතා ගේ යෝජනාව අනුව පශ්චාත් කොවිඩ් රෝගය යටතෙන් පසු පාසැල් හැරගිය දරුවන් නැවත අධ්‍යාපනයට නැඹුරු කිරීමේ ක්‍රියා කලාපයක් හා අධ්‍යාපනය සම්බන්ධව සිසු ගුරුවරුන්ට ඇති බාධා පිලිබඳව ගරු අධ්‍යාපන ඇමතිතුමා ඇතුළු අදාල අංශ නිලධාරින් දැනුවත් කිරිමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

2022.10.14 දින කුරුවිට ප්‍රාදේශීය සභාවේ පැවති මහා සභාවේ යෝජනා අංක **05-06** සභා උද්ධෘතය

**05- 06. 2023 වර්ෂය සඳහා කුරුවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වරිපනම් හා අක්කරබදු රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තු මගින් ප්‍රකාශයට පත් කරනු ලබන ගැසට් පත්‍රයේ පලකිරිම සම්බන්ධ යෝජනාව.**

ගරු සභාපති  ප්‍රේමරත්න මල්කැකුල මහතා

**2023 වර්ෂය සඳහා කුරුවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වරිපනම් හා අක්කරබදු රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තු මගින් ප්‍රකාශයට පත් කරනු ලබන ගැසට් පත්‍රයේ පලකිරිමටත් වරිපනම් බදු හා අක්කර බදු නම සංශෝධන ඉල්ලුම්පත්‍ර හා තාවකාලික අංක නිකුත් කිරීමේ අයදුම්පත් ගාස්තුව රු. 500.00 ලෙස සංශෝධනය කිරිමටත් යෝජනා කරමි.**

ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්. සෝමරත්න මහතා.
එම යෝජනාව ස්ථිර කරමි.
ගරු සභාපති  ප්‍රේමරත්න මල්කැකුල මහතා
**මේ යටතේ කුරුවිට ප්‍රධාන කාර්යාලය,නාමල්දෙනිය උප කාර්යාලය,කිරිඇල්ල උප කාර්යාලය,දොඩම්පෙ උප කාර්යාලය  යන කාර්යාලවල අක්කර බදු හා කුරුවිට ප්‍රධාන කාර්යාලය, නාමල්දෙනිය උප කාර්යාලය,කිරිඇල්ල උප කාර්යාලවල වරිපනම් බදු හා අක්කර බදු නම සංශෝධන ඉල්ලුම්පත්‍ර හා තාවකාලික අංක නිකුත් කිරීමේ අයදුම්පත් ගාස්තුව රු. 500.00 ලෙස සංශෝධනය කිරිමටත් කටයුතු කරමු.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය
**Xxxxxxxxxxxxxxx_ගරු ප්‍රාදේශීය සභා ගරු සභාපති  ප්‍රේමරත්න මල්කැකුල මහතා ගේ යෝජනාව  අනුව 2023 වර්ෂය සඳහා කුරුවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වරිපනම් හා අක්කරබදු රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තු මගින් ප්‍රකාශයට පත් කරනු ලබන ගැසට් පත්‍රයේ පලකිරිමටත්  කාර්යාලවල වරිපනම් බදු හා අක්කර බදු නම සංශෝධන ඉල්ලුම්පත්‍ර තාවකාලික අංක නිකුත් කිරීමේ අයදුම්පත් ගාස්තුව රු. 500.00 ලෙස සංශෝධනය කිරිමටත්  ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

2022.10.14 දින කුරුවිට ප්‍රාදේශීය සභාවේ පැවති මහා සභාවේ යෝජනා අංක **05-06 සභා උද්ධෘතයේ සත්‍ය පිටපතක් බව සහතික කරමි.**

**එස්.එච්.ආර්. වීරක්කොඩි,
ලේකම්,
ප්‍රාදේශීය සභාව,
කුරුවිට.**

2022.10.14 දින කුරුවිට ප්‍රාදේශීය සභාවේ පැවති මහා සභාවේ යෝජනා අංක **05-07** සභා උද්ධෘතය

05- 07. 2023 වර්ෂය සඳහා කුරුවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අදාළව ගොඩනැගිලි සැලසුම් **අනුමතකිරිම,වීදිරේඛා නිකුත්කිරිම හා පිඹුරු අනුමත කිරිමට අදාල ගාස්තු 2023 වර්ෂයට පණවා ගාස්තු අයකිරිම සඳහා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තු මගින් ප්‍රකාශයට පත් කරනු ලබන ගැසට් පත්‍රයේ පල කිරිමට මහා සභා අනුමැතිය ලබාගැනීමේ යෝජනාව.**

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

2023 වර්ෂය සඳහා කුරුවිට **ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අදාළව ගොඩනැගිලි සැලසුම් අනුමතකිරිම,වීදිරේඛා නිකුත්කිරිම හා පිඹුරු අනුමත කිරිමට අදාල ගාස්තු සංශෝධනය කර 2023 වර්ෂයට පණවා ගාස්තු අයකිරිම සඳහා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තු මගින් ප්‍රකාශයට පත් කරනු ලබන ගැසට් පත්‍රයේ පල කිරිමට මහා සභා අනුමැතිය ලබා දීමට යෝජනා කරමි.**

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්. සෝමරත්න මහතා.**
එම යෝජනාව ස්ථිර කරමි.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

**ඒ අනුව 2023 වර්ෂයට ගොඩනැගිලි අයදුම්පත්‍ර ගාස්තුව රු. 500.00 ,වීථි රේඛා හා නොපරවාගැනීමේ සහතික නිකුත් කිරිම සඳහා රු. 1000.00, පිඹුරු අනුමත කිරීමේ ගාස්තුව (නාගරික නොවන එක් බිම් කඩක් සඳහා )රු.500.00 ලෙසද පදිංචියට සුදුසු බවට අනුකූලතා සහතික නිකුත්කිරිමට ගාස්තුව සංශෝධනය කර (නාගරික නොවන )ප්‍රදේශ සඳහා රු.3000.00 ක් ලෙසද ගාස්තු පනවමු.**

**එසේම නාගරික ප්‍රදේශයෙන් පිටත පිහිටා ඇති ප්‍රදේශවල ගොඩනැගිලි ඉදිකිරීමේදි වර්ග අඩි 1000 ක් දක්වා රු. 500.00 ක්හා ඊට වැඩි වන සෑම වර්ග අඩි 100 ක් සඳහා ම රු.150.00 බැගින් ගාස්තු අය කෙරේ.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

**Xxxxxxxxxxxxxxx_ගරු ප්‍රාදේශීය සභා ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා ගේ යෝජනාව අනුව සභා බල ප්‍රදේශයට අදාළව 2023 වර්ෂයට ගොඩනැගිලි අයදුම්පත්‍ර ගාස්තුව රු. 500.00 ,වීථි රේඛා හා නොපරවාගැනීමේ සහතික නිකුත් කිරිම සඳහා රු. 1000.00, පිඹුරු අනුමත කිරීමේ ගාස්තුව (නාගරික නොවන එක් බිම් කඩක් සඳහා )රු.500.00 ලෙසද පදිංචියට සුදුසු බවට අනුකූලතා සහතික නිකුත්කිරිමට ගාස්තුව සංශෝධනය කර (නාගරික නොවන )සඳහා රු.3000.00 ක් ලෙසද ගාස්තු පැනවීමටත් නාගරික ප්‍රෙද්ශයෙන් පිටත පිහිටා ඇති ප්‍රෙද්ශවල ගොඩනැගිලි ඉදිකිරීමේදි වර්ග අඩි 1000 ක් දක්වා රු. 500.00 ක්හා ඊට වැඩි වන**

**සෑම වර්ග අඩි 100 ක් සඳහා ම රු.150.00 බැගින් ගාස්තු අය කිරීමටත් 2023 වර්ෂයට පණවන ලද ගාස්තු අයකිරීම සඳහා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තු මගින් ප්‍රකාශයට පත් කරනු ලබන ගැසට් පත්‍රයේ පල කිරීමට මහා සභා අනුමැතිය ලබා දීමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

2022.10.14 දින කුරුවිට **ප්‍රාදේශීය සභාවේ පැවති මහා සභාවේ යෝජනා අංක 05-07 සභා උද්ධෘතයේ සත්‍ය පිටපතක් බව සහතික කරමි.**

**එස්.එච්.ආර්. වීරක්කොඩි,**
**ලේකම්,**
**ප්‍රාදේශිය සභාව,**
**කුරුවිට.**

2022.10.14 දින කුරුවිට **ප්‍රාදේශීය සභාවේ පැවති මහා සභාවේ යෝජනා අංක 05-08 සහා** උදෘතය

**05-** 08. කුරුවිට **ප්‍රාදේශීය සභාවේ**_ නාමල්දෙනිය සංචාරක ගිමන්හලේ සේවාවන් ආරම්භ කිරිම හා බදු මුදල් ගෙවීම සඳහා සහනයක් ලබාගැනීම සම්බන්ධ යෝජනාව.

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා**

කුරුවිට **ප්‍රාදේශීය සභාවේ**_ නාමල්දෙනිය සංචාරක ගිමන්හලේ සේවාවන් ආරම්භ කිරීම හා බදු මුදල් ගෙවීම සඳහා සහනයක් ලබාගැනීම සම්බන්ධව නාමල්දෙනිය එච්.එම්.ලක්සිරි පියරත්න මහතා විසින් ඉල්ලීම් ලිපියක් ඉදිරිපත්කර ඇති අතර ඒ සඳහා මහා සභා තීරනයක් ගැනීමට යෝජනා කරමි.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී තරංග නිල්මිණී මහතා.**
එම යෝජනාව ස්ථිර කරමි.

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා**

නාමල්දෙනිය සංචාරක ගිමන්හලේ සේවාවන් ආරම්භ කිරීම හා බදු මුදල් ගෙවීම සඳහා සහනයක් ලබාගැනීම සම්බන්ධව නාමල්දෙනිය එච්.එම්.ලක්සිරි පියරත්න මහතා විසින් ඉදිරිපත් කර ඇති ඉල්ලීම් ලිපිය අනුව 2021.04.08 දින නාමල්දෙනිය සංචාරක ගිමන්හල බදදු පදනම මත ලබා ගැනිමට සභාව සමග ගිවිසුම් ගතව ඇති නමුත් 2021 වර්ෂයේ පැවති කොරෝනා උවදුර හේතුවෙන් 2021 වර්ෂය තුලදි සේවාවන් ආරම්භ කිරීමට නොහැකි වූ බවත් 2022 ආරම්භ කිරිමට කටයුතු කලද ගිමන්හල ඉදිරිපිට ප්‍රධාන මාර්ගයේ කාණුව ප්‍රතිසංස්කරනය නොහැකි වීම හේතුවෙන් ව්‍යාපාර කටයුතු ආරම්භ කිරිමට නොහැකි වූ බවත් දන්වා ඇත.ඒසේම මේවන විට ගිමන්හලඉදිරිපිට කාණුව සකසා ඇති අතර ගිමන්හලේ සේවා කටයුතුද ආරම්භ කිරීමට නියමිත බැවින් ඔහු විසින් 2021/04 මස සිට 2022.10 මස දක්වා අයවිය යුතු බදු මුදලින් නිදහස් කරන ලෙස ඉල්ලා ඇත.එසේම මෙම ස්ථානයේ ව්‍යාපාරය ආරම්භ කර සාර්ථක කර ගැනිමට යම් කාලයක් ගතවන හෙයින් 5% ට මාසික කුලිය වැඩිකර ඉදිරි වසර 5 ක කාලයක් ගිමන් හල තමා වෙත බදු ලබා දෙන ලෙසද ඉල්ලා ඇත.

මේ ගිමන්හල ගැන කතා කලා. මේක අසාර්ථකයි.ඒ නිසා වාස්තු බලලා ඉදිරි කටයුතු කල යුතුයි.ඒක එයාගේ වියදමින් හදලා කුලියෙන් අඩු කරන ලෙසත් ඉල්ලා තියෙනවා.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී මංගල ඩයස් මහතා.**

**වාස්තු බලන්න ලොකු වියදමක් යන්නේ නෑ.කුලිය කපා හරින්න එකඟ වෙන් නෑ. කුලියට දෙනකොට දිගටම කුලිය ගන්න ඕනි.මම මේ ගැන කලිනුත් ප්‍රශ්න කලා.ගන්න කෙනා දිගටම කරනවද කියලා.වෙන කෙනෙකුට දෙමු කියලා.කොවිඩ් සහන දෙන්න පුළුවන්.නමුත් කුලිය කපා හරින්න බෑ.මේ පුද්ගලයා මේක ආරම්භ නොකල එක අපිට**

ප්‍රශ්නයක් නෙමේ.ගිවිසුම් ගත මුදල ගෙවන්න ඕනි.සහන දෙන්නේ කොවිඩ් වලට.මීට පෙර ක හිමියන් සඳහාද දුන්නේ ඒ සහනයයි.

<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී තරංග නිල්මිණී මහතා.</u>

ඒ බදු ගත්ත කෙනාට සහන දෙන්න.තැඹිලි ගෙඩියක් වත් විකුනුවේ නෑ.ආර්ථිකය කඩා වැටිලා.

ඒ සහන දෙන්න. කොවිඩ් සහන දෙමු.ඒ කාලෙට අදාලව දෙමු.

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා</u>

මේක හිසරදයක් වගෙයි.මේක අයවැය යෝජනාවක්.ගිය මාසේ දැම්මෙ ෂෙඩ් එක.සභා සම්මත උනානේ. ඒවා ජනවාරි ක්‍රියාත්මක වෙන කොට ඒ පුද්ගලයට දෙන්න වෙන්නේ නෑ.බොතේජු මන්ත්‍රීතුමා පැහැදිලිව කීවා මෙහි තියෙන වාස්තු දෝෂ ගැන.හදපු කෙනා ඒ ගැන කිසිදු සැලකිල්ලක් දක්වලා නෑ.කීප දෙනෙක් මේක කරන්න ගත්තත් කිසිදු සාර්ථකත්වයක් නැතුව ඇතැම් විට විශාල ගැටළු ඇති වෙලා මේ අය ගියා.ඇත්තටම මේ පුද්ගලයාට කිසිදු අලෙවියක් කරන්න උනේ නෑ. කොවිඩ් සහනය කොමසාරිස් අනුමැතිය අරන් දෙන්න.

<u>ගරු සභාපති  ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>

ඒ ඉල්ලීම අනුව සොයා බලා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය අරන් කොවිඩ් කාලසීමාවට හා ඇඳිරි නීතිය පනවන ලද කාල සීමාවට බදු නිදහස් කිරිමට කටයුතු කරමු.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

**Xxxxxxxxxxxxxxx_ගරු ප්‍රාදේශීය සභා ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා ගේ යෝජනාව** අනුව හා නාමල්දෙනිය එච්.එම්.ලක්සිරි පියරත්න මහතා විසින් ඉදිරිපත් කර ඇති ඉල්ලීම් ලිපිය අනුව නාමල්දෙනිය සංචාරක ගිමන්හලේ කටයුතු වෙනුවෙන් බදු මුදල් ගෙවීම සඳහා සහනයක් ලෙස ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ගෙන කොවිඩ් කාලසීමාවේ හා ඇඳිරි නීතිය පනවන ලද කාල සීමාවට බදු නිදහස් කර සහනය ක් ලබා දීමට **ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

2022.10.14 දින කුරුවිට **ප්‍රාදේශීය සභාවේ පැවති මහා සභාවේ යෝජනා අංක 05-08 සභා උදෘතයේ සත්‍ය පිටපතක් බව සහතික කරමි.
එස්.එච්.ආර්. වීරක්කොඩි,
ලේකම්,
ප්‍රාදේශීය සභාව,
කුරුවිට.**

05-10.කුරුවිට ප්‍රාදේශීය සභාබල ප්‍රදේශයේ අනතුරුදායක ගස් පරීක්ෂාව සඳහා 2023 වර්ෂයට අදාලව අයකරන ගාස්තු සංශෝධනය හා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තු මගින් ප්‍රකාශයට පත් කරනු ලබන ගැසට් පත්‍රයේ පල කිරිමට මහා සභා අනුමැතිය ලබාගැනීමේ යෝජනාව.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

කුරුවිට ප්‍රාදේශීය සභාබල ප්‍රදේශයේ අනතුරුදායක ගස් පරීක්ෂාව සඳහා 2023 වර්ෂයට අදාලව අයකරන අයදුම් පත්‍ර ගාස්තු සංශෝධනය කිරිමට හා හා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තු මගින් ප්‍රකාශයට පත් කරනු ලබන ගැසට් පත්‍රයේ පල කිරිමට මහා සභා අනුමැතිය ලබාදීමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා
එම යෝජනාව ස්ථිර කරමි.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා
දැනට අනතුරුදායක කොස්ගසක් පරීක්ෂා කිරිමට අයදුම්පත්‍ර ගාස්තුව රු.1500.00 යි.අනෙකුත් ගස් සඳහා රු.300.00 යි.නමුත් මේ වන විට ඉන්ධන මිල ඉහල යාමත්,තැපැල් ගාස්තුවත් ඉහල ගොස් ඇති අතර ගස් පරීක්ෂා කිරිමට හා තැපෑලටම විශාල වැයබරක් දැරිමට වෙලා. ඒ අනුව අනතුරුගස් විශාල ප්‍රමාණයක් පවතින බැවිනුත් අනිවාර්යෙන් න් මෙම ගස් පරික්ෂා කර ඉදිරිපියවරත් ගත යුතු බැවිනුත් 2023 වර්ෂයට අදාලව අනතුරුදායක කොස්ගසක් පරීක්ෂා කිරිමට අයදුම්පත්‍ර ගාස්තුව රු.1750.00 ලෙසත් අනෙකුත් අනතුරු ගස් අයදුම්පත්‍රයක් සඳහා රු.500.00 ලෙසත් ගාස්තු සංශෝධනය කරමු.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය
Xxxxxxxxxxxxxxx_ගරු ප්‍රාදේශීය සභා ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා ගේ යෝජනාව අනුව කුරුවිට ප්‍රාදේශීය සභාබල ප්‍රදේශයේ අනතුරුදායක ගස් පරීක්ෂාව සඳහා 2023 වර්ෂයට අදාලව අයකරනපෝරම ගාස්තුව අනතුරුදායක කොස්ගසක් පරීක්ෂා කිරිමට අයදුම්පත්‍ර ගාස්තුව රු.1750.00 ලෙසත් අනෙකුත් අනතුරු ගස් පෝරමයක් සඳහා රු.500.00 ලෙසත් සංශෝධනය කිරිමටත් එම ගාස්තු රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තු මගින් ප්‍රකාශයට පත් කරනු ලබන ගැසට් පත්‍රයේ පල කිරිමටත් ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx
2022.10.14 දින කුරුවිට ප්‍රාදේශීය සභාවේ පැවති මහා සභාවේ යෝජනා අංක 05-10 සභා උද්‍ධෘතයේ සත්‍ය පිටපතක් බව සහතික කරමි.

එස්.එච්.ආර්. වීරක්කොඩි,
ලේකම්,
ප්‍රාදේශිය සභාව,
කුරුවිට.

2022.10.14 දින කුරුවිට ප්‍රාදේශීය සභාවේ පැවති මහා සභාවේ යෝජනා අංක **05-11** සභා උද්‍ධෘතය

05-11. කුරුවිට ප්‍රාදේශීය සභාබල ප්‍රදේශයේ ස්ථිර දැන්වීම් පුවරු හා තාවකාලික බැනර් සඳහා **2023 වර්ෂයේදී අයකිරිමට නියමිත ගාස්තු ගැසට් පත්‍රයේ පලකිරිම** සම්බන්ධ යෝජනාව.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

කුරුවිට ප්‍රාදේශීය සභාබල ප්‍රදේශයේ ස්ථිර දැන්වීම් පුවරු හා තාවකාලික බැනර් සඳහා **2023 වර්ෂයේදී අයකිරිමට නියමිත ගාස්තු ගැසට් පත්‍රයේ පල කිරීමට යෝජනා කරමි.**

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා

**එම යෝජනාව ස්ථිර කරමි.**

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

**ඒ අනුව දැනට අයකරන ගාස්තු සංශෝධනයක් සිදුකල යුතු අතර** වේදිකා නාට්‍ය හෝ සිනමා ලේඛික ප්‍රසංගයක් නොවන වෙනත් ප්‍රසංගයක් පිළිබඳව බිත්තියක හෝ පුවරුවක ප්‍රදර්ශනයකරන ප්‍රචාරක දැන්වීම් සඳහා සංශෝධිත ගාස්තු වර්ග අඩි 01 කට)(බැනර් සඳහා) රු.100.00 ක් ද සංශෝධිත ගාස්තු වර්ග අඩි 01 කට)(ස්ථිර දැන්වීම් පුවරු සඳහා ) රු.150.00 ක් ද ලෙසත්

වේදිකා නාට්‍ය හෝ සිනමා ලේඛික ප්‍රසංගයක් පිළිබඳව බිත්තියක හෝ පුවරුවක ප්‍රදර්ශනය කරන ප්‍රචාරක දැන්වීම් සඳහා සංශෝධිත ගාස්තු වර්ග අඩි 01 කට)(බැනර් සඳහා) රු.100.00 ක් ද සංශෝධිත ගාස්තු වර්ග අඩි 01 කට)(ස්ථිර දැන්වීම් පුවරු සඳහා ) රු.150.00 ක් ද ලෙසත්

වේදිකා නාට්‍ය හෝ සිනමා ලේඛික ප්‍රසංගයක් පිළිබඳව බිත්තියක හෝ පුවරුවක ප්‍රදර්ශනය කරන ප්‍රතිදීප්ත ප්‍රචාරක දැන්වීම් සඳහාසංශෝධිත ගාස්තු වර්ග අඩි 01 කට)(බැනර් සඳහා) රු.100.00 ක් ද සංශෝධිත ගාස්තු වර්ග අඩි 01 කට)(ස්ථිර දැන්වීම් පුවරු සඳහා ) රු.150.00 ක් ද ලෙසත් වේදිකා නාට්‍ය හෝ සිනමා ලේඛික ප්‍රසංගයක් පිළිබඳව ප්‍රචාරක දැන්වීමක් නොවන්නාවූද ලණු ආධාරයෙන් ප්‍රදර්ශනය කර ඇත්තා වූ ප්‍රචාරක දැන්විමක් සඳහා සඳහාසංශෝධිත ගාස්තු වර්ග අඩි 01 කට)(බැනර් සඳහා) රු.100.00 ක් ද සංශෝධිත ගාස්තු වර්ග අඩි 01 කට)(ස්ථිර දැන්වීම් පුවරු සඳහා ) රු.150.00 ක් ද ලෙසත් වේදිකා නාට්‍ය හෝ සිනමා ලේඛික ප්‍රසංගයක් පිළිබඳව ප්‍රචාරක දැන්වීමක් නොවන්නාවූද ලණු ආධාරයෙන් ප්‍රදර්ශනය කර ඇත්තා වූ ප්‍රචාරක දැන්විමක් සඳහා සංශෝධිත ගාස්තු වර්ග අඩි 01 කට)(බැනර් සඳහා) රු.100.00 ක් ද සංශෝධිත ගාස්තු වර්ග අඩි 01 කට)(ස්ථිර දැන්වීම් පුවරු සඳහා ) රු.150.00 ක් ද ලෙසත් වේදිකා නාට්‍ය හෝ සිනමා ලේඛික ප්‍රසංගයක් පිළිබඳව ප්‍රචාරක දැන්විමක් නොවන ප්‍රතිදීප්ත ප්‍රචාරක දැන්වීම් සඳහා සංශෝධිත ගාස්තු වර්ග අඩි 01 කට)(බැනර් සඳහා) රු.100.00 ක් ද සංශෝධිත ගාස්තු වර්ග අඩි 01 කට)(ස්ථිර දැන්වීම් පුවරු සඳහා ) රු.150.00 ක් ද ලෙසත්

යම් රිය පෙට්ටියක රිය කාරයක හෝ කරත්තයක සවිකර ඇති විට හෝ ප්‍රචාරක දැන්වීමක් මතුපිට පින්තාරු කර යම් රිය පෙට්ටියක රිය කාරයක හෝ කරත්තයක ජංගම ප්‍රචාරක පුවරුවක් හෝ දැන්විමක් සඳහා සංශෝධිත ගාස්තු වර්ග අඩි 01 කට)(බැනර් සඳහා) රු.100.00 ක් ද සංශෝධිත ගාස්තු වර්ග අඩි 01 කට)(ස්ථිර දැන්වීම් පුවරු සඳහා ) රු.150.00 ක් ද ලෙසත්

වේදිකා නාට්‍ය හෝ සිනමා ලේඛික ප්‍රසංගයක් පිළිබඳව ප්‍රචාරක දැන්විමක් නොවන අධාරක මත පිහිටුවා ඇති ගුවන් ප්‍රචාරක දැන්විමක් සඳහා සංශෝධිත ගාස්තු වර්ග අඩි 01 කට)(බැනර් සඳහා)

රු.100.00 ක් ද සංශෝධිත ගාස්තු වර්ග අඩි 01 කට)(ස්ථිර දැන්වීම් පුවරු සඳහා ) රු.150.00 ක් ද ලෙසත් ගාස්තු සංශෝධනය කරමු.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

**Xxxxxxxxxxxxxx_ගරු ප්‍රාදේශීය සභා ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා ගේ යෝජනාව අනුව,** වේදිකා නාට්‍ය හෝ සිනමා ලේඛික ප්‍රසංගයක් නොවන වෙනත් ප්‍රසංගයක් පිළිබඳව බිත්තියක හෝ පුවරුවක ප්‍රදර්ශනයකරන ප්‍රචාරක දැන්වීම් සඳහා සංශෝධිත ගාස්තු වර්ග අඩි 01 කට)(බැනර් සඳහා) රු.100.00 ක් ද සංශෝධිත ගාස්තු වර්ග අඩි 01 කට)(ස්ථිර දැන්වීම් පුවරු සඳහා ) රු.150.00 ක් ද ලෙසත්

වේදිකා නාට්‍ය හෝ සිනමා ලේඛික ප්‍රසංගයක් පිළිබඳව බිත්තියක හෝ පුවරුවක ප්‍රදර්ශනය කරන ප්‍රචාරක දැන්වීම් සඳහා සංශෝධිත ගාස්තු වර්ග අඩි 01 කට)(බැනර් සඳහා) රු.100.00 ක් ද සංශෝධිත ගාස්තු වර්ග අඩි 01 කට)(ස්ථිර දැන්වීම් පුවරු සඳහා ) රු.150.00 ක් ද ලෙසත්

වේදිකා නාට්‍ය හෝ සිනමා ලේඛික ප්‍රසංගයක් පිළිබඳව බිත්තියක හෝ පුවරුවක ප්‍රදර්ශනය කරන ප්‍රතිදීප්ත ප්‍රචාරක දැන්වීම් සඳහාසංශෝධිත ගාස්තු වර්ග අඩි 01 කට)(බැනර් සඳහා) රු.100.00 ක් ද සංශෝධිත ගාස්තු වර්ග අඩි 01 කට)(ස්ථිර දැන්වීම් පුවරු සඳහා ) රු.150.00 ක් ද ලෙසත් වේදිකා නාට්‍ය හෝ සිනමා ලේඛික ප්‍රසංගයක් පිළිබඳව ප්‍රචාරක දැන්වීමක් නොවන්නාවූද ලණු ආධාරයෙන් ප්‍රදර්ශනය කර ඇත්තා වූ ප්‍රචාරක දැන්විමක් සඳහා
සඳහාසංශෝධිත ගාස්තු වර්ග අඩි 01 කට)(බැනර් සඳහා) රු.100.00 ක් ද සංශෝධිත ගාස්තු වර්ග අඩි 01 කට)(ස්ථිර දැන්වීම් පුවරු සඳහා ) රු.150.00 ක් ද ලෙසත් වේදිකා නාට්‍ය හෝ සිනමා ලේඛික ප්‍රසංගයක් පිළිබඳව ප්‍රචාරක දැන්වීමක් නොවන්නාවූද ලණු ආධාරයෙන් ප්‍රදර්ශනය කර ඇත්තා වූ ප්‍රචාරක දැන්විමක් සඳහා සංශෝධිත ගාස්තු වර්ග අඩි 01 කට)(බැනර් සඳහා) රු.100.00 ක් ද සංශෝධිත ගාස්තු වර්ග අඩි 01 කට)(ස්ථිර දැන්වීම් පුවරු සඳහා ) රු.150.00 ක් ද ලෙසත් වේදිකා නාට්‍ය හෝ සිනමා ලේඛික ප්‍රසංගයක් පිළිබඳව ප්‍රචාරක දැන්විමක් නොවන ප්‍රතිදීප්ත ප්‍රචාරක දැන්වීම් සඳහා සංශෝධිත ගාස්තු වර්ග අඩි 01 කට)(බැනර් සඳහා) රු.100.00 ක් ද සංශෝධිත ගාස්තු වර්ග අඩි 01 කට)(ස්ථිර දැන්වීම් පුවරු සඳහා ) රු.150.00 ක් ද ලෙසත්

යම් රිය පෙට්ටියක රිය කාරයක හෝ කරත්තයක සවිකර ඇති විට හෝ ප්‍රචාරක දැන්වීමක් මතුපිට පින්තාරු කර යම් රිය පෙට්ටියක රිය කාරයක හෝ කරත්තයක ජංගම ප්‍රචාරක පුවරුවක් හෝ දැන්විමක් සඳහා සංශෝධිත ගාස්තු වර්ග අඩි 01 කට)(බැනර් සඳහා) රු.100.00 ක් ද සංශෝධිත ගාස්තු වර්ග අඩි 01 කට)(ස්ථිර දැන්වීම් පුවරු සඳහා ) රු.150.00 ක් ද ලෙසත්

වේදිකා නාට්‍ය හෝ සිනමා ලේඛික ප්‍රසංගයක් පිළිබඳව ප්‍රචාරක දැන්විමක් නොවන අධාරක මත පිහිටුවා ඇති ගුවන් ප්‍රචාරක දැන්විමක් සඳහා සංශෝධිත ගාස්තු වර්ග අඩි 01 කට)(බැනර් සඳහා) රු.100.00 ක් ද සංශෝධිත ගාස්තු වර්ග අඩි 01 කට)(ස්ථිර දැන්වීම් පුවරු සඳහා ) රු.150.00 ක් ද ලෙසත් ගාස්තු **සංශෝධනය කිරිමටත් එම ගාස්තු රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තු මගින් ප්‍රකාශයට පත් කරනු ලබන ගැසට් පත්‍රයේ පල කිරිමටත් ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx**

2022.10.14 දින කුරුවිට **ප්‍රාදේශීය සභාවේ පැවති මහා සභාවේ යෝජනා අංක 05-11 සභා උද්‍ධෘතයේ සත්‍ය පිටපතක් බව සහතික කරමි.**

**එස්.එච්.ආර්. වීරක්කොඩි,**
**ලේකම්,**

**ප්‍රාදේශිය සභාව,**
**කුරුවිට.**

05-12.කුරුවිට **ප්‍රාදේශීය සභාවේ පුස්සැල්ල ආදාහනාගාරයේ ආදාහනගාස්තු 2023 වර්ෂය සඳහා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තු මගින් ප්‍රකාශයට පත් කරනු ලබන ගැසට් පත්‍රයේ පල කිරිමට මහා සභා අනුමැතිය ලබාගැනීමේ යෝජනාව.**

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා ගේ දැනුම්දීම මත මෙම යෝජනාව ඉදිරි මහා සභා න්‍යාය පත්‍රයට ඇතුලත් කිරිමට තීරනය විය.**

2022.10.14 දින කුරුවිට ප්‍රාදේශීය සභාවේ පැවති මහා සභාවේ යෝජනා අංක **05-13** සභා උද්ඝෘතය

**05- 13.** කුරුවිට ප්‍රාදේශීය සභාවේ ජල බවුසරය ලබාදීම සඳහා **2023** වර්ෂයේ අයකරනු ලබන ගාස්තු රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තු මගින් ප්‍රකාශයට පත් කරනු ලබන ගැසට් පත්‍රයේ පල කිරිමට මහා සභා අනුමැතිය ලබාගැනීමේ යෝජනාව.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

කුරුවිට ප්‍රාදේශීය සභාවේ ජල බවුසරය ලබාදීම සඳහා **2023** වර්ෂයේ අයකරනු ලබන ගාස්තු රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තු මගින් ප්‍රකාශයට පත් කරනු ලබන ගැසට් පත්‍රයේ පල කිරිමට මහා සභා අනුමැතිය ලබාදීමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

**2023** වර්ෂයේදී ජල බවුසරය ලබාදීමේ දී ගාස්තු සංශෝධනයක් කල යුතුයි. ඒ අනුව ජලය සහිත ජල බවුසරය සඳහා රු.**2000.00** ක්ද ජල බවුසරය රඳවාගැනීම සඳහා පැය **6** සිට පැය **24** දක්වා රු. **1000.00** ක්ද වශයෙන් ගාස්තු පනවමු.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

**Xxxxxxxxxxxxxx**_ගරු ප්‍රාදේශීය සභා ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා ගේ යෝජනාව අනුව කුරුවිට ප්‍රාදේශීය සභාවේ ජල බවුසරය ලබාදීම සඳහා **2023** වර්ෂයේ අයකරනු ලබන ගාස්තු ලෙස ජලය සහිත ජල බවුසරය සඳහා රු.**2000.00** ක්ද ජල බවුසරය රඳවාගැනීම සඳහා පැය **6** සිට පැය **24** දක්වා රු. **1000.00** ක්ද වශයෙන් ගාස්තු පනවා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තු මගින් ප්‍රකාශයට පත් කරනු ලබන ගැසට් පත්‍රයේ පල කිරිමට මහා සභා අනුමැතිය ලබාදීමට ඒකමතිකව මහා සභා සම්මත විය.**Xxxxxxxxxxxxx**

2022.10.14 දින කුරුවිට ප්‍රාදේශීය සභාවේ පැවති මහා සභාවේ යෝජනා අංක **05-13** සභා උද්ඝෘතයේ සත්‍ය පිටපතක් බව සහතික කරමි.

**එස්.එච්.ආර්. වීරක්කොඩි,**
**ලේකම්,**
**ප්‍රාදේශිය සභාව,**
**කුරුවිට.**

**05-14. 2023 වර්ෂය සඳහා කුරුවිට ප්‍රාදේශීය සභාවේ අක්කරබදු හා කේ පෝරම බෙදාහැරීම සම්බන්ධ යෝජනාව.**

2022.10.14 දින කුරුවිට **ප්‍රාදේශීය සභාවේ පැවති මහා සභාවේ යෝජනා අංක 05-15 සභා උද්‍ධෘතය**

**05-15. 2023 වර්ෂය සඳහා කුරුවිට ප්‍රාදේශීය සභාවේ මහජන ක්‍රිඩාංගනය වෙන්කිරීමේ ගාස්තු රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තු මගින් ප්‍රකාශයට පත් කරනු ලබන ගැසට් පත්‍රයේ පල කිරිමට මහා සභා අනුමැතිය ලබාගැනීමේ යෝජනාව.**

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා**

**2023 වර්ෂය සඳහා කුරුවිට ප්‍රාදේශීය සභාවේ මහජන ක්‍රිඩාංගනය වෙන්කිරීමේ ගාස්තු රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තු මගින් ප්‍රකාශයට පත් කරනු ලබන ගැසට් පත්‍රයේ පල කිරිමට මහා සභා අනුමැතිය ලබා දීමට යෝජනා කරමි.**

**ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා**

**එම යෝජනාව ස්ථිර කරමි.**

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා**

**ඒ අනුව සභා** බල ප්‍රදේශය තුල පාසල්, සියළුම පෙර පාසල් සඳහා රු.1500.00 ක්ද බල ප්‍රදේශයෙන් පිටත පාසල්/ සියළුම පෙර පාසල් සඳහා රු. 2000.00 ක්ද කුරුවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ලියාපදිංචි ක්‍රීඩා සමාජ සඳහා සහනදායී මුදලරු. 2000.00 ක්ද කුරුවිට චාන්ස් ක්‍රීඩා සමාජය ( මුදල් අය කිරීම් සිදු කරන තරඟ සඳහා සහනදායි මුදල) රු.2000.00 ක්ද කුරුවිට චාන්ස් ක්‍රීඩා සමාජය මුදල් පදනමකින් තොරව සිදු කරනු ලබන ක්‍රීඩා පුහුණු තරඟ සඳහා රු. 2000.00 ක් ද කුරුවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිළධාරින් අතර පවත්වනු ලබන ක්‍රීඩා තරඟ හා උත්සව ගාස්තු නිදහස් කිරිමටද කුරුවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ලියාපදිංචි වැඩිහිටි බල මණ්ඩල සහ ආබාධිතයන්ගේ සංගමය සඳහා ගාස්තු නිදහස් කිරිමටද කුරුවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වසරකට එක් වතාවක් පවත්වන අන්තර් යෞවන ක්‍රීඩා සමාජ සඳහා ගාස්තු නිදහස් කිරිමටද කුරුවිට ප්‍රාදේශීය සභාව විසින් පවත්වනු ලබන තරඟ සහ උත්සව සඳහා ගාස්තු නිදහස් කිරිමටද කුරුවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ලියාපදිංචි නොමැති ක්‍රීඩා සමාජ හා අනෙකුත් සංවිධාන සහ පෞද්ගලික ආයතන සඳහා රු. 7500.00 ලෙසද පාසල් ක්‍රීඩා තරඟ සහ උත්සව සඳහා ඇප මුදල් වශයෙන් රු. 5000.00 ක්ද ඇප මුදල් වශයෙන්(ක්‍රීඩා පිටිය පළුදු කිරිම් සිදු නොකර නිසි පරිදි ක්‍රීඩා පිටියේ කැලි කසල ඉවත් කර ඇත්නම් මෙම රැඳවුම් මුදල නිදහස් කරනු ලැබේ.) රු. 10,000.00 ක් වශයෙන්ද ලෙස **ගාස්තු රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තු මගින් ප්‍රකාශයට පත් කරනු ලබන ගැසට් පත්‍රයේ පල කිරිමටත් කුරුවිට මහජන ක්‍රීඩා පිටියේ ආරක්ෂාවට ගැටලුවක් වන බැවින් සංගීත සංදර්ශන හා කානිවල් සඳහා ක්‍රීඩා පිටිය ලබා නොදීමටත් කටයුතු කරමු.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

**Xxxxxxxxxxxxxx_ගරු ප්‍රාදේශීය සභා ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා ගේ යෝජනාව අනුව 2023 වර්ෂය සඳහා** කුරුවිට **ප්‍රාදේශීය සභාවේ මහජන ක්‍රීඩාංගනය වෙන්කිරීමේ ගාස්තු , සභා** බල ප්‍රදේශය තුල පාසල්, සියළුම පෙර පාසල් සඳහා රු.1500.00 ක්ද බල ප්‍රදේශයෙන් පිටත පාසල්/ සියළුම පෙර පාසල් සඳහා රු. 2000.00 ක්ද කුරුවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ලියාපදිංචි ක්‍රීඩා සමාජ සඳහා සහනදායී මුදලරු. 2000.00 ක්ද කුරුවිට චාන්ස් ක්‍රීඩා සමාජය ( මුදල් අය කිරීම් සිදු කරන තරඟ සඳහා සහනදායි මුදල) රු.2000.00 ක්ද කුරුවිට චාන්ස් ක්‍රීඩා සමාජය මුදල් පදනමකින් තොරව සිදු කරනු ලබන ක්‍රීඩා පුහුණු තරඟ සඳහා රු. 2000.00 ක් ද කුරුවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිළධාරින් අතර පවත්වනු ලබන ක්‍රීඩා තරඟ හා උත්සව ගාස්තු නිදහස් කිරිමටද කුරුවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ලියාපදිංචි වැඩිහිටි බල මණ්ඩල සහ ආබාධිතයන්ගේ සංගමය සඳහා ගාස්තු නිදහස් කිරිමටද කුරුවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වසරකට එක් වතාවක් පවත්වන අන්තර් යෞවන ක්‍රීඩා සමාජ සඳහා ගාස්තු නිදහස් කිරිමටද කුරුවිට ප්‍රාදේශීය සභාව විසින් පවත්වනු ලබන තරඟ සහ උත්සව සඳහා ගාස්තු නිදහස් කිරිමටද කුරුවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ලියාපදිංචි නොමැති ක්‍රීඩා සමාජ හා අනෙකුත් සංවිධාන සහ පෞද්ගලික ආයතන සඳහා රු. 7500.00

ලෙසද පාසල් ක්‍රීඩා තරඟ සහ උත්සව සඳහා ඇප මුදල් වශයෙන් රු. 5000.00 ක්ද ඇප මුදල් වශයෙන්(ක්‍රීඩා පිටිය පළුදු කිරීම් සිදු නොකර නිසි පරිදි ක්‍රීඩා පිටියේ කැලි කසල ඉවත් කර ඇත්නම් මෙම රැඳවුම් මුදල නිදහස් කරනු ලැබේ.) රු. 10,000.00 ක් වශයෙන්ද ලෙස **ගාස්තු රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තු මගින් ප්‍රකාශයට පත් කරනු ලබන ගැසට් පත්‍රයේ පල කිරීමටත් කුරුවිට මහජන ක්‍රීඩා පිටියේ ආරක්ෂාවට ගැටලුවක් වන බැවින් සංගීත සංදර්ශන හා කානිවල් සඳහා ක්‍රීඩා පිටිය ලබා නොදීමටත් ත් ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx**

2022.10.14 දින කුරුවිට **ප්‍රාදේශීය සභාවේ පැවති මහා සභාවේ යෝජනා අංක 05-15 සභා උද්ධෘතයේ සත්‍ය පිටපතක් බව සහතික කරමි.**

**එස්.එච්.ආර්. වීරක්කොඩි,**
**ලේකම්,**
**ප්‍රාදේශිය සභාව,**
**කුරුවිට.**

..........................................

2022.10.14 දින කුරුවිට ප්‍රාදේශීය සභාවේ පැවති මහා සභාවේ යෝජනා අංක **05-16** සභා උද්‍යතය

**05-16. 2023 වර්ෂය සඳහා කුරුවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ විනෝද බදු ආඥා පනත යටතේ වන බදු ගාස්තු රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තු මගින් ප්‍රකාශයට පත් කරනු ලබන ගැසට් පත්‍රයේ පල කිරිමට මහා සභා අනුමැතිය ලබාගැනීමේ යෝජනාව.**

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

**2023 වර්ෂය සඳහා කුරුවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ විනෝද බදු ආඥා පනත යටතේ වන බදු ගාස්තු රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තු මගින් ප්‍රකාශයට පත් කරනු ලබන ගැසට් පත්‍රයේ පල කිරිමට යෝජනා කරමි.**

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා
එම යෝජනාව ස්ථිර කරමි.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

ඒ අනුව **කුරුවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල කරනු ලබන සියළු චිත්‍රපටි ප්‍රදර්ශනයක් ,රජයේ අනුමත වීඩියෝ දර්ශනයක් මැජික් සංදර්ශනයක් සර්කස් සංදර්ශනයක් හා සෑම සංගීත සංදර්ශනයක් සඳහාම එම දර්ශනය නැරඹීම සඳහා නිකුත් කරනු ලබන ප්‍රවේශ පත්‍ර වලින් 10% ක විනෝද බද්ධක් 2023 වර්ෂයට පනවා අයකරගැනීම සඳහා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තු මගින් ප්‍රකාශයට පත් කරනු ලබන ගැසට් පත්‍රයේ පල කිරිමට කටයුතු කරමු.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

**Xxxxxxxxxxxxxxx_ගරු ප්‍රාදේශීය සභා ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා ගේ යෝජනාව අනුව 2023 වර්ෂය සඳහා කුරුවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ විනෝද බදු ආඥා පනත යටතේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල කරනු ලබන සියළු චිත්‍රපටි ප්‍රදර්ශනයක් ,රජයේ අනුමත වීඩියෝ දර්ශනයක් මැජික් සංදර්ශනයක් සර්කස් සංදර්ශනයක් හා සෑම සංගීත සංදර්ශනයක් සඳහාම එම දර්ශනය නැරඹීම සඳහා නිකුත් කරනු ලබන ප්‍රවේශ පත්‍ර වලින් 10% ක විනෝද බද්ධක්පනවා අයකරගැනීම සඳහා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තු මගින් ප්‍රකාශයට පත් කරනු ලබන ගැසට් පත්‍රයේ පල කිරිමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

2022.10.14 දින කුරුවිට **ප්‍රාදේශීය සභාවේ පැවති මහා සභාවේ යෝජනා අංක 05-16 සභා උද්‍ඝෘතයේ සත්‍ය පිටපතක් බව සහතික කරමි.**

**එස්.එච්.ආර්. වීරක්කොඩි,**
**ලේකම්,**
**ප්‍රාදේශීය සභාව,**
**කුරුවිට.**

<u>2022.10.14 දින කුරුවිට</u> **<u>ප්‍රාදේශීය සභාවේ පැවති මහා සභාවේ යෝජනා අංක 05-17 සභා</u>**
**<u>උද්‍ඝෘතය</u>**

**05-17. 2023 වර්ෂය සඳහා කුරුවිට ප්‍රාදේශීය සභාව මගින් අයකරනු ලබන වාහන හා සත්ව බදු ගාස්තු රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තු මගින් ප්‍රකාශයට පත් කරනු ලබන ගැසට් පත්‍රයේ පල කිරිමට මහා සභා අනුමැතිය ලබාගැනීමේ යෝජනාව**

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>

**2023 වර්ෂය සඳහා කුරුවිට ප්‍රාදේශීය සභාව මගින් අයකරනු ලබන පහත සඳහන් වාහන හා සත්ව බදු ගාස්තු රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තු මගින් ප්‍රකාශයට පත් කරනු ලබන ගැසට් පත්‍රයේ පල කිරිමට යෝජනා කරමි.**
(i) මෝටර් රථයක් ජීන්, මෝටර් ලොරියක්, මෝටර් කාරයක්, මෝටර් බයිසිකලයක් හෝ කරත්තයක්, රික්ෂෝවක්,බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා - රු.25.00 ක්

(ii) සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක්, හෝ සෑම කරත්තයක් සඳහා
(අ) වෙළෙඳ කාර්යයක් සඳහා යොදවන්නේ නම් රු. 18.00
(ආ) වෙළෙඳ නොවන කාර්යයක් සඳහා යොදවන්නේ නම් රු. 4.00
(iii) සෑම කරත්තයක් සඳහාරු.20.00

(iv) සෑම අත් කරත්තයක් සඳහාරු.10.00

(v) සෑම රික්ෂෝවක් සඳහාරු. 7.50

(vi) සෑම අශ්වයෙකු, පෝනියෙකු හෝ කොටළුවෙකු සඳහාරු. 15.00

(vii) සෑම ඇතෙකු සඳහා රු. 50.00 වශයෙන්

(02) විශ්කම්භය අඟල නොඉක්මවන රෝද සහිත ළමා වාහන හුදෙක්, විල්බැරෝ, පෞද්ගලික ස්ථාන වල පමණක් වෙළෙඳ කාර්යය සඳහා යොදවන අත්කරත්ත සහ වෙළෙඳාමේ කාර්යය සඳහා නොයොදවන අත් කරත්ත ඉහත ගෙවීමෙන් නිදහස් කෙරේ. විකිණීම සඳහා හෝ අන්‍යාකාරයනින් යෙම් "වෙළෙඳ කාර්යය" උපලේඛනයේ ව්‍යාපාරයක් නැතහොත් කර්මාන්තයක් සඳහා වූ යම් ද්‍රව්‍ය හෝ බඩු හෝ යම් ලිඛිත නැතහොත් මුද්‍රිත ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීම ඇතුළත් වේ.

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා</u>
එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය
**Xxxxxxxxxxxxxx_ගරු ප්‍රාදේශීය සභා ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා ගේ යෝජනාව අනුව 2023 වර්ෂය සඳහා කුරුවිට ප්‍රාදේශීය සභාව මගින් අයකරනු ලබන ඉහත සඳහන් වාහන හා සත්ව බදු ගාස්තු,** මෝටර් රථයක් ජීන්, මෝටර් ලොරියක්, මෝටර් කාරයක්, මෝටර් බයිසිකලයක් හෝ කරත්තයක්, රික්ෂෝවක්,බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා -රු.25.00 ක් ලෙසද සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක්, හෝ සෑම කරත්තයක් සඳහා (අ) වෙළෙඳ කාර්යයක් සඳහා යොදවන්නේ නම් රු. 18.00,(ආ) වෙළෙඳ නොවන කාර්යයක් සඳහා යොදවන්නේ නම් රු. 4.00, සෑම කරත්තයක් සඳහාරු.20.00, සෑම අත් කරත්තයක් සඳහාරු.10.00, සෑම රික්ෂෝවක් සඳහාරු. 7.50,සෑම අශ්වයෙකු, පෝනියෙකු හෝ කොටළුවෙකු සඳහාරු. 15.00, සෑම ඇතෙකු සඳහා රු.

50.00 වශයෙන් ද ලෙසත් විශ්කම්භය අඟල නොඉක්මවන රෝද සහිත ළමා වාහන හුදෙක්, විල්බැරෝ, පෞද්ගලික ස්ථාන වල පමණක් වෙළෙඳ කාර්යය සඳහා යොදවන අත්කරත්ත සහ වෙළෙඳාමේ කාර්යය සඳහා නොයොදවන අත් කරත්ත ඉහත ගෙවීමෙන් නිදහස් කෙරේ. විකිණීම සඳහා හෝ අන්‍යාකාරයනින් යෙම් "වෙළෙඳ කාර්යය" උපලේඛනයේ ව්‍යාපාරයක් නැතහොත් කර්මාන්තයක් සඳහා වූ යම් ද්‍රව්‍ය හෝ බඩු හෝ යම් ලිඛිත නැතහොත් මුද්‍රිත ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීම ද අතුලත්වන පරිදි **රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තු මගින් ප්‍රකාශයට පත් කරනු ලබන ගැසට් පත්‍රයේ පල කිරිමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx**

2022.10.14 දින කුරුවිට **ප්‍රාදේශීය සභාවේ පැවති මහා සභාවේ යෝජනා අංක 05-17 සහා උදෘතයේ සත්‍ය පිටපතක් බව සහතික කරමි.**

**එස්.එච්.ආර්. වීරක්කොඩි,**
**ලේකම්,**
**ප්‍රාදේශිය සභාව,**
**කුරුවිට.**

2022.10.14 දින කුරුවිට **ප්‍රාදේශීය සභාවේ පැවති මහා සභාවේ යෝජනා අංක 05-18 සභා උද්‍ෘතය**

**05-18.** නාගරික සංවර්ධන අධිකාරිය විසින් යොමුකර ඇති සැලසුම් කමිටු දීමනා වැඩිකිරිම ලිපිය සම්බන්ධ යෝජනාව.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

නාගරික සංවර්ධන අධිකාරිය විසින් යොමුකර ඇති අංක DDG/P2/PC/LA හා 2022.06.26 දිනැති සැලසුම් කමිටු දීමනා වැඩිකිරිම සම්බන්ද ලිපිය අනුව මෙම සභාවේද සැලසුම් කමිටුවට සහභාගිවන සාමාජිකයින් හට සංශෝධිත දීමනාව අවමය ගෙවිමට යෝජනා කරමි.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ජී.එම්.ජයරත්න මහතා.**

එම යෝජනාව ස්ථිර කරමි.

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා**

**මෙම කමිටුව සදහා බැහැරින් නිලධාරින්ද සහභාගිවන අතර මෙය අත්‍යවශ්‍ය හා කඩිනමින් සිදුකල යුතු කටයුතු වේ.රු. 1500.00 සිට රු.2500.00 දක්වා මුදලක් මෙම දීමනාව වශයෙන් ගෙවිමට හැකි බව ඉහත ලිපියෙන් දන්වා ඇති අතර අවමය ලෙස රු. 1500.00 ගෙවිමට කටයුතු කරමු.මෙම දීමනාව සියළු සභා මගින් අදාල කමිටු සාමාජිකයන් හට ගෙවනු ලබන්නකි.මෙම නිලධාරින් හට ගමන් වියදම් ගෙවිම් කරන ලෙස ද ඉල්ලා ඇතත් එසේ ගමන් වියදම් ගෙවිමක් අපේ සභාව මගින් සිදු කරන්නේ නැ.ඇතැම් ප්‍රාදේශීය සභා මෙම කමිටු දිමනාව උපරිම සීමාව ගෙවනවා.නමුත් අපි අවම සීමාවේ ගෙවීම කරමු.**

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා

**සභාවේ ආදායම් තත්වය යහපත් වන තෙක් කමිටු දීමනා වැඩිකිරිම සුදුසු නොවේ.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

**Xxxxxxxxxxxxxx_ගරු ප්‍රාදේශීය සභා ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා ගේ යෝජනාව** අනුව නාගරික සංවර්ධන අධිකාරිය විසින් යොමුකර ඇති අංක DDG/P2/PC/LA හා 2022.06.26 දිනැති සැලසුම් කමිටු දීමනා වැඩිකිරිම සම්බන්ද ලිපිය අනුව මෙම සභාවේද සැලසුම් කමිටුවට සහභාගිවන සාමාජිකයින් හට සංශෝධිත දීමනාව අවමය වන රු. 1500.00 ක මුදල ගෙවීමට **ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx**

2022.10.14 දින කුරුවිට **ප්‍රාදේශීය සභාවේ පැවති මහා සභාවේ යෝජනා අංක 05-18 සභා උද්‍ෘතයේ සත්‍ය පිටපතක් බව සහතික කරමි.**

**එස්.එච්.ආර්. වීරක්කොඩි,**
**ලේකම්,**
**ප්‍රාදේශිය සභාව,**
**කුරුවිට.**

<u>2022.10. 14 දින කුරුවිට **ප්‍රාදේශීය සභාවේ පැවති මහා සභාවේ යෝජනා අංක 05- 19 සභා උද්ධෘතය**</u>

05-19.වෛද්‍ය ආධාර මුදලක් ලබාගැනීම සඳහා බෝධිමළුව, පරකඩුව බි.ජී.ජේ.සමන්ත අබේවර්ධන මහතා විසින් යොමුකරඇති ඉල්ලීම් ලිපිය සම්බන්ධ යෝජනාව.

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>
වෛද්‍ය ආධාර මුදලක් ලබාගැනීම සඳහා බෝධිමළුව, පරකඩුව බි.ජී.ජේ.සමන්ත අබේවර්ධන මහතා විසින් ඉදිරිපත් කර ඇති ඉල්ලීම් ලිපිය අනුව ඔහුගේ දියණියවන බී.ජී.පුන්සරණී සන්දීපනි දැරිය උපතින්ම පෙනහළු හා හෘද රෝගයෙන් පෙළෙන නිසා ඇයගේ ප්‍රතිකාර කටයුතු සඳහා යොදවා ගැනීමට යම් මුදල්ආධාරයක් ඉල්ලා ඇති බැවින් පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ හා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබාගෙන , සභා මුදලින් කරුණාසහගත දීමනා යටතේ රු.5000.00ක් ලබාදීමට යෝජනා කරමි.
<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා</u>
එම යෝජනාව ස්ථිර කරමි.

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>
**මෙම දැරිය සඳහා ප්‍රතිකාර කටයුතුවලට විශාල වියදමක් දැරීමට සිදුවන බවත් දැනටත් රිජ්වේ ආර්යා රෝහල මගින් ප්‍රතිකාර ලබන බවත් සුළු රැකියාවක් කරන තමා හට ප්‍රතිකාර සඳහා විශාල වියදමක් දැරීමට සිදුව ඇති බවත් ඔක්සිජන් පවා දැරියට ලබාදෙන බැවින් එම වියදම පවා පියවාගැනිමට නොහැකි බවත් දන්වා ඇත.එම නිසා මේ කටයුතු සඳහා යොදවාගැනීමට** කරුණාසහගත දීමනා යටතේ රු.5000.00 ක් ලබා දෙමු.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය
**Xxxxxxxxxxxxxxx_ගරු ප්‍රාදේශීය සභා ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා ගේ යෝජනාව අනුව හා** වෛද්‍ය ආධාර මුදලක් ලබාගැනීම සඳහා බෝධිමළුව, පරකඩුව බි.ජී.ජේ.සමන්ත අබේවර්ධන මහතා විසින් ඉදිරිපත් කර ඇති ඉල්ලීම් ලිපිය අනුව ඔහුගේ

දියණිය වන බී.ජී.පුන්සරණී සන්දීපනි දැරිය උපතින්ම පෙනහළු හා හෘද රෝගයෙන් පෙලෙන නිසා ඇයගේ ප්‍රතිකාර කටයුතු සඳහා යොදවා ගැනීමට යම් මුදල්ආධාරයක් ඉල්ලා ඇති බැවින් පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ හා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබාගෙන, සභා මුදලින් කරුණාසහගත දීමනා යටතේ රු.5000.00ක් ලබාදීමට **ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

2022.10.14 දින කුරුවිට **ප්‍රාදේශීය සභාවේ පැවති මහා සභාවේ යෝජනා අංක 05-19 සභා උදෘතයේ සත්‍ය පිටපතක් බව සහතික කරමි.**

**එස්.එච්.ආර්. වීරක්කොඩි,**
**ලේකම්,**
**ප්‍රාදේශිය සභාව,**
**කුරුවිට.**

<u>2022.10.14 දින කුරුවිට **ප්‍රාදේශීය සභාවේ පැවති මහා සභාවේ යෝජනා අංක 05-20 සභා** උදෘතය</u>

05-20. පරිසර බලපත්‍ර ගාස්තු සංශෝධනය කිරිම සම්බන්ධව මධ්‍යම පරිසර අධිකාරිය මගින් යොමුකරඇති උපදෙස්මාලාව සම්බන්ධ යෝජනාව.

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>

පරිසර බලපත්‍ර ගාස්තු සංශෝධනය කිරිම සම්බන්ධව මධ්‍යම පරිසර අධිකාරිය මගින් අංක 2264/17 හා 2022.02.27 දිනැති ගැසට් නිවේදනයේ 3 වන උප ලේඛනය අනුව යොමුකරඇති උපදෙස්මාලාව අනුව ගාස්තු අයකිරිමට හා කටයුතු කිරිමට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා</u>
එම යෝජනාව ස්ථිර කරමි.

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>

ගාස්තු සංශෝධනය කිරිම සම්බන්ධව මධ්‍යම පරිසර අධිකාරිය මගින් අංක 2264/17 හා 2022.02.27 දිනැති ගැසට් නිවේදනයේ 3 වන උප ලේඛනය අනුව යොමුකරඇති උපදෙස්මාලාව අනුව වසර තුනක් හෝ ඊට අඩුකාලයක් සඳහා පරිසර බලපත්‍ර ගාස්තුව රු.4500.00 ක් වේ.ඒ අනුව අයකිරිම් කරමු.අදාල උපදෙස් පත්‍රිකාව ද සභාගත කරමි.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

**Xxxxxxxxxxxxxx_ගරු ප්‍රාදේශීය සභා ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා ගේ යෝජනාව අනුව හා** මධ්‍යම පරිසර අධිකාරිය මගින් අංක 2264/17 හා 2022.02.27 දිනැති ගැසට් නිවේදනයේ 3 වන උප ලේඛනය අනුව යොමුකරඇති උපදෙස්මාලාව අනුව මෙම සභාව මගින් නිකුත්කරනු ලබන වසර තුනක් හෝ ඊට අඩුකාලයක් සඳහා වන පරිසර බලපත්‍රයක ගාස්තුව රු.4500.00 ක් ලෙස අයකිරිමට **ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx**

2022.10.14 දින කුරුවිට **ප්‍රාදේශීය සභාවේ පැවති මහා සභාවේ යෝජනා අංක 05-21 සභා උද්ධෘතය**

05-21. 2022.09.12 දින කුරුවිට **ප්‍රාදේශීය සභාවේ පැවති පුස්තකාල උපදේශන කමිටුවේදී ගන්නා ලද තිරන ක්‍රියාත්මක කිරිම සඳහා** මහා සභා අනුමැතිය ලබාගැනීම සම්බන්ධ යෝජනාව.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

2022.09.12 දින කුරුවිට **ප්‍රාදේශීය සභාවේ පැවති පුස්තකාල උපදේශන කමිටුවේදී ගන්නා ලද තිරන ක්‍රියාත්මක කිරිම සඳහා සහ 22.09.12 දින පැවති පුස්තකාල උපදේශන කමිටුවේ වාර්තාව සඳහා** මහා සභා අනුමැතිය ලබාදීමට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා**
එම යෝජනාව ස්ථිර කරමි.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

**ප්‍රධාන වශයෙන් කුරුවිට,කිරිඇල්ල,දොඩම්පෙ උපකාර්යාලවල පුස්ථකාල පොත් සම්බන්ධව දිගුකාලිනව පැවති ගැටළු කීපයක් සම්බන්ධව තීරන පවතිනවා.ඒ අනුව කුරුවිට මහජන පුස්ථකාලයේ හිටපු පුස්ථකාලයාධිපතිනි යක වන එන්.ඩබ්. හේමමාලි මිය විසින් 2018 වර්ෂයේ සිට බැහැරදෙන ලද මෙතෙක් නොලැබුන රු.5323 .00 ක වටිනාකම ඇති පොත් 18 ක සම්බන්ධව ඒවා ලබාගැනිමට ලිපි යැවුවද මෙතෙක් ප්‍රතිචාරයක් නොමැතිවිම හා එම ලිපිනයන්හි ඇතැමුන් පදිංචිය වෙනස් කරඇති විම වැනි ගැටළු මත සොයාගත නොහැකි හෙයින් පහතින් නම් සඳහන් පොත් 18 පරිග්‍රහනයෙන් කපා හැරිමට කමිටු තීරනය ලබා දී ඇත.**

| <u>පරි.ග්‍ර.අංකය</u> | <u>පොතේ නම</u> |
|---|---|
| 1.1719 | අධ්‍යාපනමනෝවිද්‍යාව |
| 2.4717. | ලංකාවේ ඉතිහාසය |
| 3.5685. | කරුවල ගුහාව |
| 4.6673. | පුංචි රොසලින් |
| 5.6014. | හර්මන් තල්මසා |
| 6.6245. | හොඳ දඟ මල්ල |
| 7.5839. | භාවනාව |
| 8.7015. | පාට වලාකුළු |
| 9.7164. | පොදු පුරුෂයා |
| 10.6589. | උළු ගෙදර |
| 11.6757. | හෙවනැල්ල |
| 12.4570 | සන්නිවේදන මූල ධර්ම |
| 13.6317. | නව මිනිසෙකුවියහැකිමග |
| 14.7132. | සුභාෂිණී |
| 15.7047. | නිකිණි සිහිනය. |
| 16.7575. | හිමිඅහිමි. |
| 17.6762. | ආදරවන්තයා |
| 18.7174. | හැන්දෑව. |

එසේම කුරුවිට පුස්ථකාලයේ 2021 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂනයෙන් ඌන වී ඇති පොත් 05 සම්බන්ධයෙන් 2022 භාණ්ඩ සමීක්ෂනයෙන් පසුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට තීරනය කර ඇත.

කිරිඇල්ල පුස්ථකාලයේ 2012 වර්ෂයේ සිට රේණුකා මල්කාන්ති මියගෙන් ඌන වී ඇති රු.627.50 ක වටිනාකම ඇති රාමායනය(2444),මිසරශිෂ්ඨාචාරය(5829),සිංහල දෙමල ඉංග්‍රිසි (6094) පොත් 03 ද එල්.ජී.ඒ.එස් රණවීර මිය විසින් ජේ.ඒ.වී.එස්.ඔබේසේකර මියට පුස්තකාල කටයුතු භාරදෙන අවස්ථාවේ ඌනවී තිබු රු.1159.00 ක වටිනාකමින් යුත් පවුලේ වෙදපොත(927),සිල් සුවඳ(6089),අපේම අම්මා (6449),දුක් බිය නැති ජිවිතය (6587),ගිත සංදේශය (1510) යන පොත් 05 ද පරිග්‍රහන ලේඛනයෙන් කපාහැරිමට තීරනය කර ඇත.

දොඩම්පෙ මහජන පුස්තකාලයේ බැහැර දී මෙතෙක් නොලැබුන වසර 14 ක පමන දිර්ඝ කාලයක් ගතවූ ඌන පොත් වන චිත්‍රා මාලනි මිය බැහැරදි නොලැබුන රු.1899.00 ක වටිනාකම් ඇති සාපලත් රාත්‍රිය (2622), බොඳමීදුම් 01(2457), බොඳ මිදුම් 02 (2459), ජෛව විවිධත්ව ආදර්ශ(2522),සෙනුරි (2750),සෙනුරි 02(2754) සංජනා (2892), ෂර්ලොක් හොම්ස් අන්තරායි අඩවියක (2968) යන පොත් 08 ද ජයවික්‍රම මයා බැහැරදි නොලැබුන රු.792.50 ක වටිනාකම ඇතිභාෂාව ඉගැන්වීමේ නව ක්‍රම (1785), ලෝක සිතියම් පොත (2059),පසුගිය විභාග ප්‍රශ්න උත්තර (2389),සාර්ථකත්වයේ රහස් (2908) යන පොත් 04 ද ජයලත් මයා බැහැරදී නොලැබුන රු.815.00 ක වටිනාකමින් යුතු පොත් චේතනා(2714), වනදිවි සැරිසර(2632) මානසික රෝග හඳුනා ගමු(2787) පිරුණු හදක් (2361) අන්තිම දුම්රිය (2367) යන පොත් 05 ද 2008 වර්ෂයේ සිට ඌනවී ඇති රු.1317.50 ක වටිනාකම ඇති පහත සඳහන් පොත් 14 ක්ද පරිග්‍රහන ලේඛනයෙන් කපාහැරිමට තීරනය වි ඇත.

පරි.ග්‍රු.අංකය       පොතේ නම

1.1967 හෙළ කදුළු මුහුදට එක් උනාදෝ
2.2020 බුදුබව පතනා බලංගොඩ ආනන්ද මෛත්‍රිය මා හිමිපානෝ.
3. 2258. කුමර කුමරි
4.2227. වත්තල පිංගෙඩිය
5.2405. 6 ශේණිය ගණිතය
6.2528. දේශිය අත්බෙහෙත්
7.2619. සෝවියට් දේශ්ය බිඳ වැටීම
8.2645. කෘෂි විද්‍යාව
9.2695 .ජනවහරින් තේරවිලි.

10.2697. කමත් බස
11.2702 .වරදට දඩුවම
12.2707 .බිත්තර කුමාරයා
13.2780. භුගෝල විද්‍යාව
14.2802. වන්නම් අඩව් කස්තිරම්

මෙම පොත් කපා හැරීම් සඳහා අනුමැතිය දෙමු.

එසේම පුස්තකාල කටයුතු ගැටළුවක් නොවිමට මාස 6න් 6ට යාවත්කාලීන කිරිමටත් පුස්ථකාලය තුල සියළු ආගම් නියෝජනය කරමින් අන්තවාදි නොවන පොත් එකතුවක් පවත්වාගැනිමටත් තීරනය වි ඇති අතර අප සභා බල ප්‍රෙද්ශයෙන් පිටත පිහිටි අයගම ප්‍රාදේශිය සභාවට අයත් ප්‍රදේශයේ පදංචි අයගෙන් කිරිඇල්ල පුස්තකාලයේ සාමාජිකත්වය ඉල්ලා ඉල්ලිම් පවතින බැවින් එය මහා සභාව දැනුවත්කර හා අයගම ප්‍රාෙද්ශීය සභාවද දැනුවත්කර සිදුකල යුතු බවට තීරනය වි ඇත.එසේම 22.09.12 දින පැවති පුස්තකාල උපදේශන කමිටුවේ වාර්තාවද සභාගත කරමි.ඒ සඳහා ද අනුමැතිය ලබාදෙමු.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

Xxxxxxxxxxxxxxx_ගරු ප්‍රාදේශීය සභා ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා ගේ යෝජනාව අනුව හා 2022.09.12 දින කුරුවිට ප්‍රාදේශීය සභාවේ පැවති පුස්තකාල උපදේශන කමිටුවේදී ගන්නා ලද තීරන අනුව කුරුවිට මහජන පුස්ථකාලයේ හිටපු පුස්ථකාලයාධිපතිනියක වන එන්.ඩබ්. හේමමාලි මිය විසින් 2018 වර්ෂයේ සිට බැහැරදෙන ලද මෙතෙක් නොලැබුන රු.5323 .00 ක වටිනාකම ඇති පොත් 18 වන(1719 ) අධ්‍යාපනමනෝවිද්‍යාව , 4717). ලංකාවේ ඉතිහාසය,(5685). කරුවල ගුහාව,(.6673). පුංචි රොසලින් ,.(6014). හර්මන් තල්මසා,(.6245. ) හොඳ දඟ මල්ල .(58390.) භාවනාව,.(7015. ) පාට වලාකුළු,.(7164.) පොදු පුරුෂයා.(6589). උළු ගෙදර..(6757). හෙවනැල්ල.(.4570 ) සන්නිවේදන මුල ධර්ම.(6317). නව මිනිසෙකුවියහැකිමග..(71320.) සුභාෂිණි..(7047.) නිකිණි සිහිනය.(7575.) හිමිඅහිමි...(6762.) ආදරවන්තයා.(.7174. ) හැන්දෑව. යන පොත්ද කිරිඇල්ල

පුස්ථකාලයේ 2012 වර්ෂයේ සිට රේණුකා මල්කාන්ති මියගෙන් ඌන වී ඇති රු.627.50 ක වටිනාකම ඇති රාමායනය(2444),මිසරශිෂ්ඨාචාරය(5829),සිංහල දෙමල ඉංග්‍රිසි (6094) පොත් 03 ද එල්.ජී.ඒ.එස් රණවීර මිය විසින් ජේ.ඒ.වී.එස්.ඔබේසේකර මියට පුස්තකාල කටයුතු භාරදෙන අවස්ථාවේ ඌනවී තිබු රු.1159.00 ක වටිනාකමින් යුත් පවුලේ වෙදපොත(927),සිල් සුවඳ(6089),අපේම අම්මා (6449),දුක් බිය නැති ජීවිතය (6587),ගිත සංදේශය (1510) යන පොත් 05 ද දොඩම්පෙ මහජන පුස්තකාලයේ බැහැර දී මෙතෙක් නොලැබුන වසර 14 ක පමන දිර්ඝ කාලයක් ගතවු ඌන පොත් වන චිත්‍රා මාලනි මිය බැහැරදි නොලැබුන රු.1899.00 ක වටිනාකම් ඇති සාපලත් රාත්‍රිය (2622), බොඳමීදුම් 01(2457), බොඳ මිදුම් 02 (2459), ජෛව විවිධත්ව ආදර්ශ(2522),සෙනුරි (2750),සෙනුරි 02(2754) සංජනා (2892), ෂර්ලොක් හොම්ස් අන්තරායි අඩවියක (2968) යන පොත් 08 ද ජයවික්‍රම මයා බැහැරදි නොලැබුන රු.792.50 ක වටිනාකම ඇතිභාෂාව ඉගැන්වීමේ නව ක්‍රම (1785), ලෝක සිතියම් පොත (2059),පසුගිය විභාග ප්‍රශ්න උත්තර (2389),සාර්ථකත්වයේ රහස් (2908) යන පොත් 04 ද ජයලත් මයා බැහැරදී නොලැබුන රු.815.00 ක වටිනාකමින් යුතු පොත් චේතනා(2714), වනදිවි සැරිසර(2632) මානසික රෝග හඳුනා ගමු(2787) පිරුණු හදක් (2361) අන්තිම දුම්රිය (2367) යන පොත් 05 ද 2008 වර්ෂයේ සිට ඌනවී ඇති රු.1317.50 ක වටිනාකම ඇති .1967 ) , හෙළ කඳුළ මුහුදට එක් උනාදෝ ,(2020 ) බුදුබව පතනා බලංගොඩ ආනන්ද මෛත්‍රිය මා හිමිපානෝ.( 2258.) කුමර කුමරි(2227. ) වත්තල පිංගෙඩිය (2405. ) 6 ශේණිය ගණිතය(2528. )දේශිය අත්බෙහෙත් 2619. සෝවියට් දේශ්ය බිඳ වැටිම(2645) කෘෂි විද්‍යාව(2695) .ජනවහරින් තේරවිලි.(2697.) කමත් බස (.2702) .වරඳට දඩුවම(2707) .බිත්තර කුමාරයා(2780.) භූගෝල විද්‍යාව(.2802). වන්නම් අඩවි කස්තිරම් යන පොත් 14 ද පරිග්‍රහන ලේඛනයෙන් කපාහැරිමට හා එසේම 22.09.12 දින පැවති පුස්තකාල උපදේශන කමිටුවේ වාර්තාවේ සඳහන් තීරන ක්‍රියාත්මක කිරිමට **අනුමැතිය ලබා දිමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

2022.10.14 දින කුරුවිට **ප්‍රාදේශීය සභාවේ පැවති මහා සභාවේ යෝජනා අංක 05-21 සභා උදෘතයේ සත්‍ය පිටපතක් බව සහතික කරමි.**

**එස්.එච්.ආර්. වීරක්කොඩි,**
**ලේකම්,**
**ප්‍රාදේශිය සභාව,**
**කුරුවිට.**

2022.10.14 දින කුරුවිට ප්‍රාදේශීය සභාවේ පැවති මහා සභාවේ යෝජනා අංක **05-22** සභා උද්ධෘතය

05- 22.කුරුවිට ප්‍රාදේශීය **සභාවේ සේවක නය ලේඛනයේ වසර 10 ට වැඩි අයනොවූ ණය ශේෂ සම්බන්ධ මහා සභා තීරනයක් ලබාගැනීමේ යෝජනාව.**

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

කුරුවිට ප්‍රාදේශීය සභාවේ සේවක නය ලේඛනයේ වසර **10** ට වැඩි අයනොවූ ණය ශේෂ මුදල **වන රු.28782.00 ක මුදල කපා හැරීම සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට ඉදිරිපත්කිරීමට යෝජනා කරමි.**

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

**සේවක නය ලේඛනයේ වසර 10 ට වැඩි අයනොවූ ණය ශේෂ සම්බන්ධව හා ඒවා අයකරගැනිමට ගත් ක්‍රියාමාර්ග ගැන නිතර විගනන විමසුම් තියෙනවා. මේවා අතරින් අයකරගැනිමට තොරතුරු සොයාගත නොහැකි වූ පහත සඳහන් ණය ශේෂ කපාහැරීමට අනුමැතිය ලබාගමු.ඒවා වසර 10 ට වැඩි පැරණි ඒවා.අයකරගැනීමට තොරතුරු සොයාගත නොහැකි වූ නිලධාරින්ගේ සේවක නය ශේෂය 2022.08.31 දිනට පහත පරිදි වේ.**

| අනු අංකය | නම | **2022.08.31** දිනට හිඟ ශේෂය |
|---|---|---|

| | | |
|---|---|---|
| 01 | බී.එම්.එඩ්මන් ගුණවර්ධන මයා | 1,000.00 |
| 02 | එම්.ජයවීර මයා | 1,017.00 |
| 03 | එච්. ලීලාරත්න මයා | 1,230.00 |
| 04 | එස්. ජයතුංග මයා | 3,060.00 |
| 05 | එච්.ඒ. ගුණසේකර මයා | 1,050.00 |
| 06 | ඩබ්.ඒ. කරුණාසේන මයා | 5,700.00 |
| 07 | කේ.බී.ටී. පත්මසිරි මයා | 5,135.00 |
| 08 | කේ.ඩබ්.එම්.සී. වසන්ත කුමාර මයා | 490.00 |
| 09 | කේ. චන්ද්‍රා | 10,100.00 |
| | **එකතුව** | 28,782.00 |

**මෙම නිලධාරීන්ගේ තොරතුරු සොයාගැනීමට උත්සහකලද නොහැකිවී ඇත.**
**මෙම ණය ශේෂ කපාහැරීම සම්බන්ධ සාධාරනීකරන වාර්තාවද මහා සභාවට ඉදිරිපත්කරනලදී.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

**Xxxxxxxxxxxxxxx_ගරු ප්‍රාදේශීය සභා ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා ගේ යෝජනාව අනුව කුරුවිට ප්‍රාදේශීය සභාවේ සේවක නය ලේඛනයේ වසර 10 ට වැඩි අයනොවූ ණය ශේෂ මුදල වන රු.28782.00 ක මුදල කපා හැරීම සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට ඉදිරිපත්කිරීම ට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx**

2022.10.14 දින කුරුවිට ප්‍රාදේශීය සභාවේ පැවති මහා සභාවේ යෝජනා අංක **05-22** සභා උද්‍ධතයේ සත්‍ය පිටපතක් බව සහතික කරමි.

**එස්.එච්.ආර්. වීරක්කොඩි,**
**ලේකම්,**
**ප්‍රාදේශිය සභාව,**
**කුරුවිට.**

2022.10.14 දින කුරුවිට ප්‍රාදේශීය සභාවේ පැවති මහා සභාවේ යෝජනා අංක **05-23** සභා උද්‍ධෘතය

05- 23.කුරුවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සුසානභූමි සභාවට පවරාගැනීම සම්බන්ධ යෝජනාව.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-

කුරුවිට **ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුල පිහිටි රජය සතු පහත නම් සඳහන් සුසාන භූමි ප්‍රාදේශීය සභාව වෙත නීත්‍යානුකූලව පවරාගැනීම ට මහා සභා අනුමැතිය ලබාදීමට යෝජනා කරමි.**

**1.**කාහේන්ගම වැලිහිඳ **සුසාන භූමිය**
**2.සොහොන්භූමි තෙප්පනාව සුසාන භූමිය**
**3.ඇල්ලගාව පොදු සුසාන භූමිය**
**4.**බඳුවල කන්ද **සුසාන භූමිය**
**5.පුස්සැල්ල සොහොන්බිම් සුසානභූමිය.**
**6.**කාහේන්ගම **සුසාන භූමිය**
**7.**ආදර්ශ ගම්මාන ග්‍රාමීය මාර්ග පොදු **සුසාන භූමිය**
**8.**එරත්න තේ ජනපද පොදු **සුසාන භූමිය**
**9.**නාගොඩ ගොන්නගහහේන **සුසාන භූමිය**
**10.**නාමල්දෙනිය **සුසාන භූමිය**
**11.**එරත්න ලස්සකන්ද **සුසාන භූමිය**
**12.**දෙල්ගහඹිවිට **සුසාන භූමිය**
**13.**පොහොරබාව මොන්ට්‍රික්‍රිස්ටෝ **සුසාන භූමිය**
**14.හුනුගල්දෙනිය සුසානභූමිය.**
**15.**පුස්සැල්ල සොහොන්ගොඩ **සුසාන භූමිය**
**16.**ගබ්බෙල හිඳැල්ලන **සුසාන භූමිය**
**17.**මෙනේරිපිටිය **සුසාන භූමිය**
**18.**මිනුවන්දෙනිය **සුසාන භූමිය**
**19.කඳන්ගොඩ ජනපද සුසානභූමිය**
**20.**තෙපුලන්ගොඩ **සුසාන භූමිය**
**21.**පැරඩයිස් ඉසුරු පෙදෙස පොදු **සුසාන භූමිය**
**22.**දෙවිපහල දික්හේන පොදු **සුසාන භූමිය**
**23.**එල්ලාවල පහලගම දිසානායකවත්ත පොදු **සුසාන භූමිය**
**24.**ගොරකාඇල **සුසාන භූමිය**

25.පොහොරබාව පොලැල්වත්ත **සුසාන භූමිය**
26.පුවක්ගහවෙලවත්ත **සුසාන භූමිය**
27.සුදාගල පාතලස්සකන්ද පොදු **සුසාන භූමිය**
28.කාහේන්ගම තලගහපිටිය **සුසාන භූමිය**
29.බොරලැස්සඉඩම (රෝහල අසල) **සුසාන භූමිය**
30.මාටුවාගල වත්ත **සුසාන භූමිය**
31. උතුරු එක්නැලිගොඩ අත්වැල්පිටිය **සුසාන භූමිය**
32. උතුරු එක්නැලිගොඩ තුංදොල **සුසාන භූමිය**
33.බටතොට උස්සදෙනිය **සුසාන භූමිය**
34.මහවත්තකන්ද **සුසාන භූමිය**
35.ඒදණ්ඩවෙල කනත්ත(රේල්පාර අයින ) **සුසාන භූමිය**
..................................

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා
එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය
**Xxxxxxxxxxxxxxx_ගරු ප්‍රාදේශීය සභා ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා ගේ යෝජනාව අනුව** කුරුවිට **ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුල පිහිටි රජය සතු ඉහත නම් සඳහන් සුසාන භූමි ප්‍රාදේශීය සභාව වෙත නීත්‍යානුකූලව පවරාගැනීම ට මහා සභා අනුමැතිය ලබාදීමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx**

2022.10.14 දින කුරුවිට **ප්‍රාදේශීය සභාවේ පැවති මහා සභාවේ යෝජනා අංක 05-23 සභා උද්‍ධෘතයේ සත්‍ය පිටපතක් බව සහතික කරමි.**

**එස්.එච්.ආර්. වීරක්කොඩි,**
**ලේකම්,**
**ප්‍රාදේශිය සභාව,**
**කුරුවිට.**

2022.10.14 දින කුරුවිට ප්‍රාදේශීය සභාවේ පැවති මහා සභාවේ යෝජනා අංක **05-24** සභා උද්ධෘතය

05- 24.කුරුවිට **ප්‍රාදේශීය සභාවේ කිරිඇල්ල මහජන පුස්තකාලය සඳහා නව සාමාජිකයන් බඳවා ගැනීම සම්බන්ධ යෝජනාව.**

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-**

කුරුවිට **ප්‍රාදේශීය සභාවේ කිරිඇල්ල මහජන පුස්තකාලය සඳහා නව සාමාජිකයන් බඳවා ගැනීම සම්බන්ධ තීරනයක් ලබාගැනීමට යෝජනා කරමි.**

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා

එම යෝජනාව ස්ථිර කරමි.

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-**

කුරුවිට **ප්‍රාදේශීය සභා** වට අයත්_කිරිඇල්ල උපකාර්යාලයේ මහජන පුස්තකාලයට **සාමාජිකත්වය සදහා ඉල්ලීම් පවතින බවත් අයගම ප්‍රාදේශිය සභාවට අයත් මඩබද්දර ,කැටේපොල,නමුනුතැන්න,ගලතුර,වැනි කිරිඇල්ල පුස්තකාලයට ආසන්නව පදිංචි ජනතාව මෙම පුස්තකාලයේ සාමාජිකත්වය ඉල්ලා සිටියද ඒ ජනතාවගේ පදිංචිය අයගම බලප්‍රදේශයේ නිසා සාමාජිකත්වය ලබාදිමට ගැටළු පවතින බවත් පුස්තකාල සහායක විසින් දන්වා ඇත.එහෙත් එම පිරිස් හට අයගම සභාවේ පුස්තකාලයට යාමට විශාල දුරක් ඇති අතර එම හේතුවෙන් අයගම පුස්තකාලයේ සාමාජිකත්වය ලබාගැනීමට උනන්දු නොවන බවත් දන්වා ඇත.ඒ අනුව 2023 වර්ෂයට සංශෝධිත පුස්තකාල සාමාජිකත්ව ගාස්තු යටතේ2023 වසරේ සිට මෙම අයගම සභා බලප්‍රෙද්ශයට අයත් සාමාජිකත්වය ඉල්ලන පිරිස හට නිත්‍යානුකූල ක්‍රමවේදය අනුව සාමාජිකත්වය ලබාදෙමු.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

**Xxxxxxxxxxxxxx_ ප්‍රාදේශීය සභා ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා ගේ යෝජනාව හා කිරිඇල්ල මහජන පුස්තකාලයේ පුස්තකාල සහායක ගේ ඉල්ලීම් ලිපිය අනුව කුරුවිට ප්‍රාදේශීය සභාවේ කිරිඇල්ල මහජන පුස්තකාලය සඳහා නව සාමාජිකයන් බඳවා ගැනීම යටතේ 2023 වර්ෂයට සංශෝධිත පුස්තකාල සාමාජිකත්ව ගාස්තු අනුව 2023 වසරේ සිට මෙම අයගම සහා බලප්‍රෙද්ශයට අයත් සාමාජිකත්වය ඉල්ලන පිරිස හට නිත්‍යානුකූල ක්‍රමවේදය යටතේ කිරිඇල්ල මහජන පුස්තකාලයේ සාමාජිකත්වය ලබාදිමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx**

2022.10.14 දින කුරුවිට **ප්‍රාදේශීය සභාවේ පැවති මහා සභාවේ යෝජනා අංක 05-24 සභා උදෘතයේ සත්‍ය පිටපතක් බව සහතික කරමි.**

**එස්.එච්.ආර්. වීරක්කොඩි,**
**ලේකම්,**
**ප්‍රාදේශිය සභාව,**
**කුරුවිට.**

<u>2022.10.14 දින කුරුවිට **ප්‍රාදේශීය සභාවේ පැවති මහා සභාවේ යෝජනා අංක 05-25 සභා උදෘතය**</u>

05-25.2022.09.20 දින කුරුවිට **ප්‍රාදේශීය සභාවේ පැවති ජල විදුලි බලාගාර සමග කරන ලද සාකච්ජාවෙදි ගත් තීරන ක්‍රියාත්මක කිරිම සම්බන්ධ යෝජනාව.**

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-</u>

25.2022.09.20 දින කුරුවිට **ප්‍රාදේශීය සභාවේ පැවති ජල විදුලි බලාගාර සමග කරන ලද සාකච්ජාවෙදි ගත් තීරන ක්‍රියාත්මක කිරිම සඳහා මයා සභා අනුමැතිය ලබා දීමට යෝජනා කරමි.**

<u>**ගරු ප්‍රාදේශීය සභා** උප සභාපති අනිල් ලියනගේ මහතා</u>

එම යෝජනාව ස්ථිර කරමි.

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-</u>

**බටතොට කුඩා ජල විදුලි බලාගාරය සමග සභාව ගිවිසුම්ගතවි ඇති අතර වාර්ෂිකව නිපදවන විදුලි ඒකකයට ශත එකක මුදලක් ගෙවයි. දැනට සියයට එකක් ගෙව්වත් අදාල සමාගම සමග සාකච්වා කොට මෙම ගෙවිම වැඩිකරගත හැකි බවත් දැනුම් දුන්නා.**

**සාකච්ජාවෙදි සභාවේ නිතිඥතුමාගේ උපදෙස් පරිදි අනෙකුත් බලාගාර අයිති සමාගම් සමගද ගිවිසුම්ගත වන ලෙසට උපදෙස් ලැබිණි.**

**එරත්න අධියර 11 (කොල්ලමලේ බලාගාරය),ගෝමල ඔය බලාගාරය,වර්ණගල එරත්න බලාගාරය,මරුකන්ද ජල විදුලි බලාගාරය,බින්අතුර ඇල බලාගාරය,තෙබුවන කීරගල සුළු පරිමාන ජල විදුලි විදුලි බලාගාරය,අයත් සමාගම් සමග මෙසේ ගිවිසුම්ගත වියයුතුය.**

<u>**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී මංගල ඩයස් මහතා.**</u>

**ශත 10 කින් පමන වැඩිකර ගමු.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

**Xxxxxxxxxxxxxxx_ගරු ප්‍රාදේශීය සභා ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා ගේ යෝජනාව අනුව 2022.09.20 දින කුරුවිට ප්‍රාදේශීය සභාවේ පැවති ජල විදුලි බලාගාර සමග කරන ලද සාකච්ඡාවෙදි ගත් තීරන පරිදි කුරුවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල පිහිටි එරත්න අධියර 11 (කොල්ලමලේ බලාගාරය),ගෝමල ඔය බලාගාරය,වර්ණගල එරත්න බලාගාරය,මරුකන්ද ජල විදුලි බලාගාරය,බින්අතුර ඇල බලාගාරය,තෙබුවන කීරගල සුළු පරිමාන ජල විදුලි විදුලි බලාගාරය,අයත් සමාගම් සමග ද ගිවිසුම් ගත වී ඉදිරි කටයුතු කිරිමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

2022.10.14 දින කුරුවිට **ප්‍රාදේශීය සභාවේ පැවති මහා සභාවේ යෝජනා අංක 05-25 සභා උද්‍ධෘතයේ සත්‍ය පිටපතක් බව සහතික කරමි.**

**එස්.එච්.ආර්. වීරක්කොඩි,**
**ලේකම්,**
**ප්‍රාදේශිය සභාව,**
**කුරුවිට.**

<u>2022.10.14 දින කුරුවිට **ප්‍රාදේශීය සභාවේ පැවති මහා සභාවේ යෝජනා අංක 05-26 සභා උද්‍ධෘතය**</u>

05-26. අතිපූජ්‍ය මඩලගම වජිරබුද්ධි මහානායක හිමිපානන්ගේ අපවත්විම හේතුවෙන් ආදාහන කමිටුවේ තීරනය පරිදි කුරුවිට ප්‍රාදේශිය සභාව මගින් සවිකරන ලද තොරණ වෙනුවෙන් ගෙවිම් කිරීම සඳහා මහා සභා අනුමැතිය ලබාගැනීමේ යෝජනාව.

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>

අතිපූජ්‍ය මඩලගම වජිරබුද්ධි මහානායක හිමිපානන්ගේ අපවත්විම හේතුවෙන් ආදාහන කමිටුවේ තීරනය පරිදි කුරුවිට ප්‍රාදේශිය සභාව මගින් සවිකරන ලද තොරණ වෙනුවෙන් මුදල් කමිටුවේ ආවරණ අනුමැතියට යටත්ව රු.98500.00 ක මුදලක් ලේසර් හෝල්ඩිංස් පුද්ගලික සමාගම ,නො.332,උඩකඩ පාර,දෙල්ගමුව, කුරුවිට වෙත වවුචර් අංක 1540 හා 22.10.06 දිනැතිව ගෙවිම් කර ඇති අතර ඒ සඳහා මහා සභා අනුමැතිය ද ලබා දීමට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා</u>

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

**ආදාහනඋත්සව කටයුතු විවිධ ආයතන මගින් බෙදාගෙන සිදු කිරිමට තීරනය වු අතර මෙම තොරණ සවිකිරිම ප්‍රාදේශිය සභාවෙන් සිදුකල යුතුබව ආදාහන කමිටුව තීරණය කලා. ඒ අනුව මේ කටයුත්ත සිදුකිරිමට පෙර ඒ සඳහා සඳහා පළාත් පාලන සහකාර කොමසාරිස්තුමාගේ වාචික අනුමැතියද ලබා ගත්තා. 22.09.04 දින මුදල් කමිටුවෙන්ද මෙම ගෙවිම සම්බන්ධව අනුමැතිය ලබා දි ඇත.මේ සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියද ලබාගන්න.**

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ජී.එම්. ජයරත්න මහතා.**

**පළාතේ ගෞරවණීය හිමිනමක්.උන්වහන්සේ.ගුණවත් සිල්වත් පූජණීය හිමිනමක්.නමුත් සභාරිති අනුව මෙම මුදල ගෙවන්න බෑ.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

**Xxxxxxxxxxxxxxx_ගරු ප්‍රාදේශීය සභා ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා ගේ යෝජනාව අනුව** අතිපූජ්‍ය මඩලගම වජිරබුද්ධි මහානායක හිමිපානන්ගේ අපවත්විම හේතුවෙන් ආදාහන කමිටුවේ තීරනය පරිදි කුරුවිට ප්‍රාදේශිය සභාව මගින් සවිකරන ලද තොරණ වෙනුවෙන් රු.98500.00 ක මුදලක් ලේසර් හෝල්ඩිංස් පුද්ගලික සමාගම ,නො.332,උඩකඩ පාර,දෙල්ගමුව, කුරුවිට වෙත වවුචර් අංක 1540 හා 22.10.06 දිනැතිව ගෙවිම් කර ඇති අතර එම ගෙවිම් කිරීම සඳහා මහා සභා අනුමැතිය ද ලබා දීමට ත් මේ සම්බන්ධව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීමටත් **ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

2022.10.14 දින කුරුවිට **ප්‍රාදේශීය සභාවේ පැවති මහා සභාවේ යෝජනා අංක 05-26 සහා උදෘතයේ සත්‍ය පිටපතක් බව සහතික කරමි.**

**එස්.එච්.ආර්. වීරක්කොඩි,**
**ලේකම්,**
**ප්‍රාදේශිය සභාව,**
**කුරුවිට.**

05-27. කුරුවිට ප්‍රාදේශීය සභාවේ වාහනවලට යොදන ඉන්ධන පිලිබඳව ඉන්ධන දහන **පරීක්ෂාවක් සිදුකිරිම සම්බන්ධ යෝජනාව.**

<u>ගරු සභාපති  ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>
කුරුවිට ප්‍රාදේශීය සභාවේ වාහනවලට යොදන ඉන්ධන පිලිබඳව ඉන්ධන දහන **පරීක්ෂාවක් සිදුකිරිමට යෝජනා කරමි.**

<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එච්.කේ.එම්.එස්.එස්.ධනවර්ධන මහතා.</u>
එම යෝජනාව ස්ථිර කරමි.

<u>ගරු සභාපති  ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>
**රියදුරන් කියනවා ඉන්ධන දහනය විම ඉක්මන් කියලා.**

<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ජී.එම්.ජයරත්න මහතා.</u>
**අඩුවෙන් ගහනවද දන්නෑ.මේ ඉන්ධන සම්බන්ධව විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කරන්න. මෙය ගිය සභාවෙත් කීවා.**

<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී මංගල ඩයස් මහතා.</u>
**මෙය වාර්ෂිකව සිදුකල යුත්තක්.**

<u>ගරු සභාපති  ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>

**මේ දැන් මතුව ඇති තත්වය මත මෙම පරීක්ෂනය විශේෂයෙන් කරන්නේ.නැවත කරලා තත්වය බලමු.එක වාහනයක කරලා බලමු. මෙය ගැටළුවක්.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය
**Xxxxxxxxxxxxxxx_ගරු ප්‍රාදේශීය සභා ගරු සභාපති  ප්‍රේමරත්න මල්කැකුල මහතා ගේ** යෝජනාව  අනුව කුරුවිට ප්‍රාදේශීය සභාවේ වාහනවලට යොදන ඉන්ධන පිලිබඳව රියදුරන් දදැනුම්දෙන තත්වය මත විශේෂයෙන්  ඉන්ධන දහන පරීක්ෂාවක් සිදුකිරිමට ඒකමතිකව මහා සභා සම්මත විය.**Xxxxxxxxxxxxxx**
2022.10.14 දින කුරුවිට ප්‍රාදේශීය සභාවේ පැවති මහා සභාවේ යෝජනා අංක **05-27** සභා **උද්‍යතයේ සත්‍ය පිටපතක් බව සහතික කරමි.**

**එස්.එච්.ආර්. වීරක්කොඩි,**
**ලේකම්,**
**ප්‍රාදේශිය සභාව,**

කුරුවිට.

**05-28** ඇස්තමේන්තු

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල  මහතා</u>

05-28-01 යටතේ සඳහන් පහත ඇස්තමේන්තුව අනුමත කිරිමට යෝජනා කරමි.
05-28-01. මෙනේරිපිටිය මැල්වත්ත පාර කොන්ක්‍රීට් කිරිම-(100 මීටර්)-රු.1390000.00

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අසංක දිල්ෂාන් මහතා</u>

එම යෝජනාව ස්තිර කරමි.
<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල  මහතා</u>
**පුස්සැල්ල ප්‍රෙද්ශයේ ජල ව්‍යාපාතියෙන් පාරවල් කැඩිලා.ඒ තවත් කැඩිලා තියෙන පාරවල් විස්තර දෙන්න.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා</u>

**වලදූර පාර දැව සංස්ථාවෙන් දර ඇදලා . තාමත් බැරිඋනා  ඒ සම්බන්ධව විසඳුමක් ගන්න.නීත්‍යානුකූල නෑ.**
<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණී නයනා ජීවනී මිය</u>
**මමත් දුන්නා ලිපියක්.කඩිනමින් පියවරක් ගන්න.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxx** 05-28-01. මෙනේරිපිටිය මැල්වත්ත පාර කොන්ක්‍රීට් කිරිම-(100 මීටර්)-රු.1390000.00 ඇස්තමේන්තුව සඳහා අනුමැතිය ලබා දීමට **ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxx**

**01.**<u>කාරක සභාවල වාර්තා</u>

06-01 මුදල් කමිටු වාර්තාව (2022.10.01)

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-</u>
2022.10.0 දිනැති <u>මුදල් කමිටු වාර්තාව</u> සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කිරීමට හා එහි සඳහන් නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම සුදුසු බවට  යෝජනා  කරමි.එසේම මෙම මුදල් කමිටුවේ තීරන අංක 163 යටතේ රක්ෂන ගාස්තු ගෙවිම වෙනුවෙන් ගෙවිය යුතු මුදල ලෙස සටහන්ව ඇත්තේ රු.68067.70 ලෙස වන අතර එය රු.68066.70 ලෙසත් තීරන අංක 162 යටතේ ගෙවිය යුතු මුදල ලෙස සටහන්ව ඇත්තේ රු.66846.56 වන අතරඑය රු.66864.56 සෙ සංශෝධනය කිරිමටත් යෝජනා කරමි.

<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී රංජන් ප්‍රදීප් මහතා.</u>
එම යෝජනාව ස්ථිර කරමි.

තීරන අංක 171,174,181 පිලිබඳව **ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ජී.එම්.ජයරත්න මහතා විමසූ අතර** ඒ සම්බන්ධව පැවති ගැටළු නිරාකරනය කර ගන්නා ලදි.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

> **Xxxxxxxxxxxxxxx 2022.08.05** දිනැති <u>මුදල් කමිටු වාර්තාව</u> වාර්තාව **සභා සම්මත කිරීමට ත් මුදල් කමිටු වාර්තාවේ අංක**114 යටතේ සඳහන් කර ඇති සේවකයන්හට 12 දෙනා හට සේවක ඇප තැම්පත් ගෙවිම සුදුසු බවටත් **වාර්තාවේ සඳහන් නිර්දේශයන් ක්‍රියාත්ම කිරීමත් සුදුසු බවටත් ඒකමතිකව මහා සභා** 2022.08.12 දින කුරුවිට **ප්‍රාදේශීය සභාවේ පැවති මහා සභාවේ යෝජනා අංක 05-13 සභා උදෘතයේ**

**<u>06-02.කාර්මික කමිටු වාර්තාව .....................</u>**

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-

22.07.18 **<u>කාර්මික කමිටු වාර්තාව</u>** සභා අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා</u>**

22.07.18 කාර්මික කමිටු වාර්තාව සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කිරීමට හා එහි සඳහන් නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම සුදුසු බවට යෝජනා කරමි.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිණී ප්‍රේමා ගම්ලත් මිය.</u>**

එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

> **Xxxxxxxxxxxx** 22.07.18 දින කාර්මික කමිටු වාර්තාව **සභා සම්මත කිරීමට ත් එහි සඳහන් නිර්දේශයන් ක්‍රියාත්ම කිරීමත්** සුදුසු බවට **ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxx**

06-03.කුඩානගර ජල සම්පාදන කමිටු වාර්තා -22.09.06

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-</u>

කුඩානගර ජලසම්පාදනක්‍රමයේ විධායකකමිටු රැස්වීම් වාර්තාව සභාවේ දැනුවත් වීම සඳහා ඉදිරිපත් කර ඇත.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා</u>**

කුඩානගර ජලසම්පාදනක්‍රමයේ ජලය ලබාගැනීමේදි ඇප තැන්පතුවක් ගත්තා.රු. 5000.00 ක ඒක ලබාදෙන්න.

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-</u>

ඒක පිලිබදව සොයා බලා කටයුතු කරමු.

07-01. **<u>ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ</u>**

07-01.2022 අගොස්තු මස මාසික ඒකාබද්ධ වැය සාරාංශය/ලැබීම් සාරාංශය/ ආදායම් අයකිරීමේ ප්‍රගතිය

**<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා:-</u>**

2022 අගෝස්තු මස මාසික ඒකාබද්ධ වැය සාරාංශය/ලැබීම් සාරාංශය/ ආදායම් අයකිරීමේ ප්‍රගතිය සඳහා සභා අනුමැතිය ලබා ගැනීම සඳහා යෝජනා කරමි.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී සම්පත් බොතේජු මහතා.</u>**

එම යෝජනාව ස්ථිර කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා</u>**

අපි ගිමන්හලට විදුලිය බිල සභාවෙන් ගෙවනවා. ඒක අපි ගතයුත්තේ ගිවිසුම් කරුගෙන්.ගිවිසුම්ගත මුදලෙන් අයකරගත යුතුයි.

....................

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx2022 ජූනි මස මස ඒකාබද්ධ ලැබීම් සාරාංශය, ආදායම් ඇස්තමේන්තුව,ඒකාබද්ධ වැය සාරාංශය, වියදම් ඇස්තමේන්තුව, ආදායම් අයකිරීමේ ප්‍රගති වාර්තාව ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx**

07-01 . 2022 සැප්තැම්බර් මස ගෙවීම් වාර්තාව

**07-02 .2022.08.05 දිනට සභාවේ මූල්‍ය තත්වය**

**මේ සම්බන්ධව ගරු සභාපතිතුමන් විසින් වාර්තාව ඉදිරිපත් කරන ලදී.**

07-02 __ 2022 ජුලි මස ගෙවීම් වාර්තාව__

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා:-**

2022 ජූලි මස ගෙවීම් වාර්තාව සඳහා සභා අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රුවන් අශෝක මහතා :-**

2022_ජූලි _මස ගෙවීම් වාර්තාව සභා සම්මත කරන ලෙස යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණි ප්‍රේමා ගම්ලත් මිය.:-**

එම යෝජනාව ස්ථිර කරමි.

9476 ට්‍රැක්ටරය සඳහා බැටරි යෙදීම සම්බන්ධව ගැටළුව නිරාකරනය කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්. ජයරත්න මහතා :-**

ඒඩීබී ගොඩනැගිල්ල අධියර තුනක් යටතේ වැඩ කලාට සභා මුදලින් ගෙවීමට තීන්දු කලේ ප්‍රථම අධියර විතරයි.2019 වසරේ.මේක නීති ගැටළුවක් වෙයි.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා:-

ඇස්තමේන්තු මහා සභාවේ අනුමත කරලයි ගෙවන්නේ. සියළු දෙනාව දැනුවත් කරලා මෙතෙක් ගෙව්වෙත්.මෙහි ගැටළුව කුමක්ද?

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්. ජයරත්න මහතා :-

2019 වසරේ අනුමත කලේ අධියර 1 ට සභාමුදලින් ගෙවීමට.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx** 2022 ජූලි මස ගෙවීම් වාර්තාව **ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx**

2022.10.14 දින කුරුවිට **ප්‍රාදේශීය සභාවේ පැවති මහා සභාවේ** වෙනත් කරුණු අංක **08-01**යටතේ සාකච්ජා කරන ලද උද්‍යතය

08.වෙනත් කරුණු.

**08-01.සිරිපා මාර්ගයේ වර්ණගල දක්වා මාර්ගය දෙපස රක්ෂිතයක් බවට පත් කිරිම.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කැළුම් ශ්‍රී ධර්මදාස මහතා :-**

**වර්ණගල දක්වා පාර දෙපස මාර්ගයට ඉඩ ඇරලා පහසුවෙන් කඩ පෙළක් සැකසිය හැකියි.මෙය එක අතකින් සභා ආදායමක් වගේම ප්‍රදේශයේ කීප දෙනෙකුට ජීවනෝපායක් සැලසිය හැකියි.නමුත් පෙරෙයිදා කුරුවිට ප්‍රාදේශිය ලේකම් හා අඩවිවන නිලධාරින් මේ මාර්ගයට ගිහින් වර්ණගල දක්වා අධි ආරක්ෂිත කලාපයක් කරන්න තීන්දු කරලා.මේ කිසිවක් සභාවට හෝ දැනුම්දී මේ නිරීක්ෂනයට හෝ සාකච්ජාවට සහභාගීවිමක් සිදුළනේ නෑ.මා මෙයට විරුද්ධයි.වර්ණගල දක්වා පාර හැදෙන්න ඕනි.පාරට ඉඩ ඇරලා අපිට විශාල සභා ආදායමක් හදාගන්න පුළුවන්. මේ සාකච්ජාව නැවත කැඳවන්න.**

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා

**මෙය සත්‍යයක්.මේ නිරික්ෂනයට අපිව කැඳවලා නෑ.නැවත ඉල්ලා සිටින්න. කඩිනමින්.කුරුවිට ප්‍රාදේශිය ලේකම්,අඩවිවන කාර්යාලය,මධ්‍යම පරිසර අධිකාරිය වත් මේ සාකච්වාව නැවත කැඳවන්න කියලා ලිපි යවන්න.**

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා:-

**මේ සියළු අංශ වලට ලිපි යවන්න මේ කරුන සම්බන්ධව කඩිනමින් අවශ්‍ය කටයුතු කරන්න.**

2022.10.14 දින කුරුවිට ප්‍රාදේශීය සභාවේ පැවති මහා සභාවේ වෙනත් කරුණු අංක **08-01යටතේ සාකච්ඡා කරන ලද උද්ධෘතයේ සත්‍ය පිටපතක් බව සහතික කරමි.**

**එස්.එච්.ආර්. වීරක්කොඩි,**
**ලේකම්,**
**ප්‍රාදේශිය සභාව,**
**කුරුවිට.**

2022.10.14 දින කුරුවිට **ප්‍රාදේශීය සභාවේ පැවති මහා සභාවේ අංක 09 -1** හදිසි යෝජනා **යටතේ වන සභා තීරණයේ උද්ධෘතය**

09-හදිසි යෝජනා

09-01. කුරුවිට ප්‍රාදේශිය සභාවේ වෙළඳ සංකීර්ණයේ ඉහල මහලේ සම්මන්ත්‍රණ ශාලාව අංග සම්පූර්ණ කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන ලබාගැනීම සඳහා දේශීය ණය හා සංවර්ධන අරමුදලින් ණය ලබාගැනීමට හා ඒ සඳහා සැකසූ ව්‍යාපෘති යෝජනාව හා ණය ඉල්ලුම්පත සඳහා මහා සභා අනුමැතිය ලබා ගැනීමේ යෝජනාව.

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා:-**

කුරුවිට ප්‍රාදේශිය සභාවේ වෙළඳ සංකීර්ණයේ ඉහල මහලේ සම්මන්ත්‍රණ ශාලාව අංග සම්පූර්ණ කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන ලබාගැනීම සඳහා දේශීය ණය හා සංවර්ධන අරමුදලින් ණය ලබාගැනීමත් ඒ සඳහා සැකසූ ව්‍යාපෘති යෝජනාව හා ණය ඉල්ලුම්පත සඳහා මහා සභා අනුමැතිය ලබා දිමටත් යෝජනා කරමි. හදිසි යෝජනා යටතේ ඉදිරිපත් කරමි.

**ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා**

එම යෝජනාව ස්ථිර කරමි.

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා:-**

මෙම සම්මන්ත්‍රණ ශාලාව අංග සම්පූර්න කිරිමට ඉතිරි ඉදිකිරීම් කටයුතු හා ආසන ආදි උපකරණ, පහසුකම්,සපයා ගත යුතුයි.මේ සඳහා සභා ප්‍රතිපාදන නොමැත.ඒ නිසා දේශීය ණය හා සංවර්ධන අරමුදලින් ණය ලබාගැනීමට සැකසූ ව්‍යාපෘති යෝජනාව හා ණය ඉල්ලුම්පත ඒ සඳහා යොමු කරමු.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා විසින් ඉදිරිපත් කරන ලද හදිසි යෝජනාව අනුව කුරුවිට ප්‍රාදේශිය සභාවේ වෙළඳ සංකීර්ණයේ ඉහල මහලේ සම්මන්ත්‍රණ ශාලාව අංග සම්පූර්ණ කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන**

ලබාගැනීම සඳහා දේශීය ණය හා සංවර්ධන අරමුදලින් ණය ලබාගැනීමටත් ඒ සඳහා සැකසූ ව්‍යාපෘති යෝජනාව හා ණය ඉල්ලුම්පත සඳහා මහා සභා අනුමැතිය ලබා දීමටත් **ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxx**

2022.10.14 දින කුරුවිට **ප්‍රාදේශීය සභාවේ පැවති මහා සභාවේ අංක 09 -1** හදිසි යෝජනා **යටතේ වන සභා තීරණයේ උද්‍ධෘතයේ සත්‍ය පිටපතක් බව සහතික කරමි.**

**එස්.එච්.ආර්. වීරක්කොඩි,**
**ලේකම්,**
**ප්‍රාදේශීය සභාව,**
**කුරුවිට.**

09-01 නිවාඩු අනුමත කිරීම

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ණී දයා කස්තුරි මිය, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විකසිත පුෂ්පසූරිය මහතා , ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ණී නයනා ජීවනි මිය, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි.කේ.කුලරත්න මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජීවන් අබේවික්‍රමපාල මහතා හදිසියේ අසනිප වි ඇති අතර නිවාඩු ලබා දිමට ගරු යෝජනා කරමි.හදිසි යෝජනා යටතේ ඉදිරිපත් කරමි.

ප්‍රාදේශීය සභා මන්ත්‍රී ණී ප්‍රේමා ගම්ලත් මිය

එම යෝජනාව ස්ථිර කරමි.
ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx_ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ණී දයා කස්තුරි මිය, , ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ණී නයනා ජීවනි මිය, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විකසිත පුෂ්පසූරිය මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි.කේ.කුලරත්න මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජීවන් අබේවික්‍රමපාල මහතා හදිසියේ අසනිප වී ඇති අතර නිවාඩු අනුමත කිරිමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxx**

- **ස්තූතිය.**

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා:-

අද දින මහා සභාව සඳහා සියළු සංග්‍රහ කටයුතු පෞද්ගලික මුදලින් සිදුකල **ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා හට ස්තුතිය පිරිනමන අතර අද දින සභාව සඳහා සහභාගි වී** සහය ලබාදුන් සියළු දෙනා හට ස්තූතිය පල කරමි.

සභාවේ කටයුතු ප.ව. 3.15 ට පමණ අවසන් කරන ලදී.

ප්‍රේමරත්න මල්කැකුළ
සභාපති,
ප්‍රාදේශීය සභාව,
කුරුවිට.

පිටපත් : -
01.කුරුවිට ප්‍රාදේශීය සභාවේ සියලුම මන්ත්‍රීතුමන්ලා වෙතට - (දැ.ගැ.පි)
02.පළාත් පාලන සහකාර කොමසාරිස්තුමා - (දැ.ගැ.පි)
03.විගණකාධිපති,විගණකාධිපති උපකාර්යාලය,මහ නගර සභාව,රත්නපුර - (දැ.ගැ.පි)
04.ප්‍රධාන කාර්යාලයේ සියලුම වැඩසටහන් සහකාරවරුන්,සංවර්ධන නිළධාරීන්, කළමණාකාර සහකාරවරුන් හා කාර්මික නිලධාරීන් වෙතට - ඔබ විෂයට අදාල කටයුතු කිරීමට
05.කාර්ය භාර නිලධාරීන් - එල්ලාවල, කිරිඇල්ල, දොඩම්පේ - ඔබ කාර්යාලයට අදාල කරුණ ගැන අවධානය යොමු කිරීමට
06.ප්‍රජා සංවර්ධන නිලධාරී(දැ.ග.පි.)

**02.** 01-1 පසුගිය මහා සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම. (2022.09.09)
01-2 විශේෂ මහා සභා රැස්විම් වාර්තාව සභා සම්මත කිරිම (2022.09.20 )

**03.**සභාපතිතුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන - අති පූජ්‍ය මඩලගම වජිරබුද්ධි මහානායක හිමිපානන්ගේ අපවත්වීම සම්බන්ධ ශෝකය පලකිරිම.

**04.**ප්‍රාදේශිය සභාව අමතා එවනලද සංදේශ පෙත්සම් පැමිණිලි හා සන්නිවේදන

**05.** යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න - නැත

**06.**<u>යථා පරිදි කල් දී ඇති යෝජනා-</u>

**<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා.</u>**

**05-01. දෙල්ගහඕවිට ඉඩමේ ,ඉඩම් ප්‍රතිසංස්කරන කොමිෂන් සභාවෙන් කුරුවිට ප්‍රාදේශිය සභාව වෙත ලබාදි ඇති ඉඩම් කොටස හැර ඉතිරි ඉඩම් කොටස්ද ඇතුළු සම්පූර්න ඉඩම සභාව වෙත පවරාගැනීමේ යෝජනාව.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.සෝමරත්න මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනාව.</u>**

**05- 02. කුරුවිට නගරයේ ශිලා රමණී පෙරේරා යන අය විසින් ඉදිකර ඇති අනවසර කඩ කාමරය ඉවත්කිරිමට නාගරිකසංවර්ධනඅධිකාරිය මගින් පවරා තිබූ නඩු කටයුත්ත නිම වි,එම අනවසර ඉදිකිරිම ඉවත්කිරිමට තීන්දුව ලැබී තිබුනද මෙතෙක් ඉවත්කිරිමට කටයුතු නොකිරිම සම්බන්ධ යෝජනාව.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කැළුම්ශ්‍රී ධර්මදාස මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා.</u>**

**05- 03. ඉදිරි ශ්‍රී පාද වන්දනා වාරය සඳහා අඩවිකන්ද සිට හැරම්ටිපාන දක්වා ශ්‍රී පාද මාර්ගය සුද්ධ පවිත්‍ර කිරිම සම්බන්ධ යෝජනාව.**

**05- 04. එරත්න නගරයේ පෙට්‍රල් හා ඩීසල් පොම්ප 2 ක් සවිකරගැනීම සම්බන්ධ යෝජනාව.**

**<u>යථා පරිදි කල් දී ඇති යෝජනා යටතේ ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන අනෙකුත් යෝජනා.</u>**

**05-05. කුරුවිට ප්‍රාදේශීය සභාවේ 2023 අයවැය වාර්තාව සඳහා මහා සභා අනුමැතිය ලබාදීම සම්බන්ධ යෝජනාව.**

05- 09. කුරුවිට **ප්‍රාදේශීය සභාවේ_** නාමල්දෙනිය සංචාරක ගිමන්හලේ අළුත්වැඩියා කටයුතු සම්බන්ධ යෝජනාව.

**<u>05-28. ඇස්තමේන්තු</u>**

ලේකම්තුමිය/සභාපතිතුමා,

**2023 වර්ෂය සඳහා පහත දැක්වෙන ගාස්තු අය කරනු ලබන ස්ථිර දැන්වීම් පුවරු හා තාවකාලික බැනර් ගැසට් පත්‍රයේ පල කිරීම හා සංශෝධනය කිරීම සම්බන්ධවයි.**

2023 වර්ෂය සඳහා කුරුවිට ප්‍රාදේශිය සභාවට අයත් බල ප්‍රදේශය තුල ස්ථාපිත ස්ථිර දැන්වීම් පුවරු සහ තාවකාලික බැනර් සහ දැන්වීම් පුවරු සඳහා පහත ගාස්තු ප්‍රමාණ රජයේ මුද්‍රණ දෙපාර්තුමේන්තුව මගින් ප්‍රකාශයට පත් කරනු ලබන ගැසට් පත්‍රයේ පල කිරීම සඳහා ඔබගේ කාරුණික අනුමැතිය පතමි.

| | විස්තරය | මාසයකට හෝ ඉන් කොටසක් සඳහා වර්ග අඩි 01 කට (බැනර් සඳහා) රු ශත | සංශෝධිත ගාස්තු වර්ග අඩි 01 කට (බැනර් සඳහා) රු ශත | වර්ෂයකට වර්ග අඩි 01 කට රු ශත | සංශෝධිත ගාස්තු වර්ග අඩි 01 කට රු ශත |
|---|---|---|---|---|---|
| I | වේදිකා නාට්‍ය හෝ සිනමා ලේඛික ප්‍රසංගයක් නොවන වෙනත් ප්‍රසංගයක් පිළිබඳව බිත්තියක හෝ පුවරුවක ප්‍රදර්ශනය කරන ප්‍රචාරක දැන්වීම් සඳහා | 50.00 | 100.00 | 100.00 | 150.00 |
| II | වේදිකා නාට්‍ය හෝ සිනමා ලේඛික ප්‍රසංගයක් පිළිබඳව බිත්තියක හෝ පුවරුවක ප්‍රදර්ශනය කරන ප්‍රචාරක දැන්වීම් සඳහා | 50.00 | 100.00 | 100.00 | 150.00 |
| III | වේදිකා නාට්‍ය හෝ සිනමා ලේඛික ප්‍රසංගයක් පිළිබඳව බිත්තියක හෝ පුවරුවක ප්‍රදර්ශනය කරන ප්‍රතිදීප්ත ප්‍රචාරක දැන්වීම් සඳහා | 50.00 | 100.00 | 100.00 | 150.00 |
| IV | වේදිකා නාට්‍ය හෝ සිනමා ලේඛික ප්‍රසංගයක් පිළිබඳව ප්‍රචාරක දැන්වීමක් නොවන්නාවූද ලණු ආධාරයෙන් ප්‍රදර්ශනය කර ඇත්තා වූ ප්‍රචාරක දැන්වීමක් සඳහා | 50.00 | 100.00 | 100.00 | 150.00 |
| V | වේදිකා නාට්‍ය හෝ සිනමා ලේඛික ප්‍රසංගයක් පිළිබඳව ප්‍රචාරක දැන්වීමක් නොවන ප්‍රතිදීප්ත ප්‍රචාරක දැන්වීම් සඳහා | 50.00 | 100.00 | 100.00 | 150.00 |
| VI | යම් රිය පෙට්ටියක රිය කාරයක හෝ කරත්තයක සවිකර ඇති විට හෝ ප්‍රචාරක දැන්වීමක් මතුපිට පින්තාරු කර යම් රිය පෙට්ටියක රිය කාරයක හෝ කරත්තයක ජංගම ප්‍රචාරක පුවරුවක් හෝ දැන්වීමක් සඳහා | 50.00 | 100.00 | 100.00 | 150.00 |
| VII | වේදිකා නාට්‍ය හෝ සිනමා ලේඛික ප්‍රසංගයක් පිළිබඳව ප්‍රචාරක දැන්වීමක් නොවන අධාරක මත පිහිටුවා ඇති ගුවන් ප්‍රචාරක දැන්වීමක් සඳහා | 50.00 | 100.00 | 100.00 | 150.00 |

ආර්.එම්.යු.කේ.ඒකනායක,
KPS/AD/13
2022.10.04

**<u>2023 වර්ෂය සඳහා පහත දැක්වෙන වාහන හා සත්ත්ව බදු ලෙස ගාස්තු සම්බන්ධයෙන් ගැසට් පත්‍රයේ පල කිරීම සම්බන්ධවයි.</u>**

2023 වර්ෂය සඳහා කුරුවිට ප්‍රාදේශීය සභාවට අයත් ගාස්තු අය කරනු ලබන පහත සඳහන් වාහන හා සත්ත්ව බදු රජයේ දෙපාර්තමේන්තුව මඟින් ප්‍රකාශයට පත් කරනු ලබන ගැසට් පත්‍රයේ පල කිරීම සඳහා ඔබගේ කාරුණික අනුමැතිය පතමි.

**උපලේඛනය**

**(01)**

| | |
|---|---|
| (i) මෝටර් රථයක් ජීප්, මෝටර් ලොරියක්, මෝටර් කාරයක්, මෝටර් බයිසිකලයක් හෝ කරත්තයක්, රික්ෂෝවක්,බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා | රු.25.00 |
| (ii) සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක්, හෝ සෑම කරත්තයක් සඳහා<br>(අ) වෙළෙඳ කාර්යයක් සඳහා යොදවන්නේ නම්<br>(ආ) වෙළෙඳ නොවන කාර්යයක් සඳහා යොදවන්නේ නම් | <br><br>රු. 18.00<br>රු. 4.00 |
| (iii) සෑම කරත්තයක් සඳහා | රු.20.00 |
| (iv) සෑම අත් කරත්තයක් සඳහා | රු.10.00 |
| (v) සෑම රික්ෂෝවක් සඳහා | රු. 7.50 |
| (vi) සෑම අශ්වයෙකු, පෝනියෙකු හෝ කොටළුවෙකු සඳහා | රු. 15.00 |
| (vii) සෑම ඇතෙකු සඳහා | රු. 50.00 |

(02) විශ්කම්භය අඟල නොඉක්මවන රෝද සහිත ළමා වාහන හුදෙක්, විල්බැරෝ, පෞද්ගලික ස්ථාන වල පමණක් වෙළෙඳ කාර්යය සඳහා යොදවන අත්කරත්ත සහ වෙළෙඳාමේ කාර්යය සඳහා නොයොදවන අත් කරත්ත ඉහත ගෙවීමෙන් නිදහස් කෙරේ. විකිණීම සඳහා හෝ අන්‍යාකාරයනින් යෙම් "වෙළෙඳ කාර්යය" උපලේඛනයේ ව්‍යාපාරයක් නැතහොත් කර්මාන්තයක් සඳහා වූ යම් ද්‍රව්‍ය හෝ බඩු හෝ යම් ලිඛිත නැතහොත් මුද්‍රිත ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීම ඇතුළත් වේ.